# උහන ප්‍රාදේශීය සභාවේ පැවැති 07 වන සභා වාරයේ පනස්තුන්වන සභා රැස්වීම් වාර්තාව

දිනය :- 2022.08.09 පෙ.ව. 9.30

1. ටී.පී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මයා ගරු සභාපති
2. එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා ගරු උප සභාපති
3. රංජිත් වනිගසිංහ ඒකනායක මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
4. ඒ. සුසන්ත කුමාර කුසුම්සිරි මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
5. ඩී. ආරියරත්න දෙලංකාවල මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
6. ආර්.එම්. ජයවීර රත්නායක මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
7. කේ.බී. විමලරත්න මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
8. ඊ.ආර් සුමනාවති මිය ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී
9. එල්.එච්. කරුණාසේන දයාතිලක මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
10. එන්.පී. චතුරංග දර්ශන කුමාර මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
11. පී.කේ. තරිඳු තුෂාන් ධනංජය මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
12. එන්. එච්. ලාල් ජයන්තසිරි මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
13. එල්.ආර්. චන්ද්‍රසේකර බංඩාර මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
14. එච්.පී. ජයතිලක මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
15. ඒ. ලලිත් කුමාර මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
16. කේ. ප්‍රේමසිරි මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
17. කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
18. ඒ. නන්දිකා ප්‍රියන්ති කුමාරි මිය ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී
19. ජෙ.පී. සුගන්ධි ෂාවිකා මිය ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී
20. ජේ.ආර්. ජගත් ප්‍රසන්න මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
21. ඩබ්. රාණි මැණිකේ මිය ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී
22. ඩබ්.ඩී. දර්ශන නුවන් ගරු ප්‍රා.ස.මන්ත්‍රී

නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්

1. පූජ්‍ය උඩවෙල ධම්මතිලක හිමි ගරු ප්‍රා.ස.මන්ත්‍රී
2. පී.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී
3. එම්.එම්. මාලක මිහිර බණ්ඩාර මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
4. කේ.එම්. කුලතුංග මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
5. ආර්.ඒ.ඩී. සිසිර ශාන්ත කුමාර මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
6. කේ.වී.පී. නයනා කුමුදුනි මිය ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී
7. එන්. අමරකිර්ති මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
8. එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී

ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි සියළුම මන්ත්‍රීවරු පිළිගැනීමෙන්ද ආගමික වතාවත් සිදු කිරීමෙන් අනතුරුව රට වෙනුවෙන් දිවිපිදු රණවිරුවන් සිහි කිරීමෙන්ද පසු පෙ.ව. 9.30 රැස්වීම් කටයුතු ආරම්භ කරන ලදි.

රැස්වීම ආරම්භයේදි ගරු මන්ත්‍රීවරුන් 11 දෙනෙක් පැමිණ සිටින ලදි.

| | | |
|---|---|---|
| 1. | ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මයා | ගරු සභාපති |
| 2. | රංජිත් වනිගසිංහ ඒකනායක මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 3. | ඒ. සුසන්ත කුමාර කුසුම්සිරි මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 4. | ආර්.එම්. ජයවීර රත්නායක මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 5. | කේ.බී. විමලරත්න මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 6. | ඊ.ආර් සුමනාවති මිය | ගරු ප්‍රා.ස.මන්ත්‍රිනි |
| 7. | එල්.එච්. කරුණාසේන දයාතිලක මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 8. | එන්. එච්. ලාල් ජයන්තසිරි මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 9. | එච්.පී. ජයතිලක මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 10. | කේ. ප්‍රේමසිරි මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 11. | ඩබ්.ඩී. දර්ශන නුවන් | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |

**ගරු සභාපතිතුමා**

පසුගිය සභාවාරයේදී රංජිත් ඒකනායක මන්ත්‍රීතුමා පෙන්වා දුන් අඩුපාඩුවක් වන ආගම සිහිකිරීම න්‍යාය පත්‍රයට ඇතුලත් නොවීම සම්බන්ධ කරුණ මේ සභා වාරයේදීද න්‍යාය පත්‍රයට ඇතුලත් නොවී තිබීම සම්බන්ධව මුලින්ම සමාව ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදි.ඊලඟ සභාවාරයේදී එය නිවැරදි කරන ලෙස ලේකම් තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට පවසා සිටින බව ප්‍රකාශ කරන ලදි.

**1. පසු ගිය මස සභා වාර්තාව ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපතිතුමා**

මා විසින් න්‍යාය පත්‍රය සමග ලැබෙන්නට සැලැස්වූ පසුගිය මස සභා වාර්තාව කියවන ලද සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් නොමැති නම් වාර්තාව ස්ථිර කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.9.45 ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ.දෙලංකාවල මහතා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.9.46 ගරු ප්‍රා.ස.මන්ත්‍රී එන්.ජී.චතුරංග දර්ශන කුමාර මහතා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.9.48 ගරු උප සභාපති එච්.එම්.ජගත් දේශප්‍රිය අබේවර්ධන මහතා හා ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී ජේ.පී.සුගන්ධි ෂාවිකා මිය පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.9.50 ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී ඒ.නන්දිකා ප්‍රියන්ති කුමාරි මිය පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.9.52 ගරු ප්‍රා.ස.මන්ත්‍රී පී.කේ.තරිදු තුෂාන් ධනංජය මහතා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.9.55 ගරු ප්‍රා.ස.මන්ත්‍රී එල්.ආර්.චන්ද්‍රසේකර බණ්ඩාර මහතා හා ගරු ප්‍රා.ස.මන්ත්‍රීනී ඩබ්.රාණි මැණිකේ මිය පැමිණෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා.**

සභා වාර්තාව ස්ථිර කිරීමට පෙර සභා වාර්තාවේ න්‍යාය පත්‍රයේ යම් දෝෂයක් ඇති බව පෙන්වා ගරු සභාපතිතුමා සමාව ඉල්ලූ බවත් , ඒ පිළිබඳව ස්තුති වන්ත වන බවත් , නමුත් ගිය සභාවේදීමේ පිළිබඳව දැනුවත් කල බවත්,සභා වාර්තාව පිළිබඳව මීට වඩා අවධානය යොමු කල යුතු බවත්,පෙන්වා දෙන ලදි.මෙම සභා වාර්තාව පිළිබඳ මම අද ස්තුතියක් කිරීමට සිතාගෙන පැමිණි බවත්,ප්‍රකාශ කරන ලදි.මෙම සභා වාර්තාවේ සෝදුපත් බැලීම සඳහා වෙනම කෙනෙක් පත්කර ගන්නා මෙන් ප්‍රකාශ කරන ලදි.සභා වාර්තාව සැකසීමේදී න්‍යාය පත්‍රයට මේ කරුණ නොදැමීම පිළිබඳ ප්‍රශ්නයක් පමණක් තිබෙන බවත්,නමුත් සභා වාර්තාවේ 41 වන පිටුවේ මගේ ප්‍රකාශයක් ඇති බවත් මෙතෙක් අවුරුදු හතරේදී සභා වාර්තා වල තිබූ ප්‍රකාශ ගත්විට එම ප්‍රකාශය නියම ආකාරයෙන්ම නිවැරදි ලෙස සටහන් කර ඇති බවත් ඒ පිළිබඳව ස්තුති වන්ත වන බවත්,ප්‍රකාශ කරන ලදි.පසුගිය වකවානුවල න්‍යාය පත්‍රයේ ආගම සිහිකිරීම යන වගන්තිය තිබූ බවත්,දැන් එය මේ න්‍යාය පත්‍රයෙන් ඉවත්වී ඇති බවත්,ප්‍රකාශ කරන ලදි.ඉදිරියේදී එය නිවැරදි කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපතිතුමා**

ඉදිරි සභා වාරයේදී න්‍යාය පත්‍රයට ආගම සිහිකිරීම ඇතුලත් කර ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එන්.එච්.ලාල් ජයන්ත සිරි මයා විසින් සභා වාර්තාව ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සභා වාර්තාව සම්මත විය.**

**02.ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන - නැත**

**03.සන්දේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන - නැත**

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා -**

**යෝජනා අංක 05/2022/08(01)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් 2023 අයවැය සැකසීම සම්බන්ධ මාණ්ඩලික පත්‍රය හා අයවැය කාල සටහන සහා අනුමැතිය සඳහා යෝජනා කොට ඉදිරිපත් කරන ලදි.

# <u>මාණ්ඩලික සටහන් පත්‍රය</u>

ප්‍රාදේශිය සභා පනතේ **168(1)** රීති වලින් නියම කර ඇති පරිදි මා විසින් වර්ෂය ඉකුත් වීමට පෙර ඉදිරි වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සකස් කර සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අනුමත කර ගත යුතු බව සඳහන්ව ඇත.

එසේ සකස් කර ගන්නා වූ අයවැය ලේඛනය කාල සටහනක් මඟින් සකස් කර ගැනීමට අපේක්ෂා කරමි. එකී කාල සටහන අනුව ලබන්නා වූ නව වර්ෂය වෙනුවෙන් අයවැය ලේඛනයක් සකස් කිරීමට ඔබ සැමගේ සහයෝගය අපේක්ෂා කරනු ඇත. විශේෂයෙන්ම ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයේ සම්පූර්ණ සහයෝගය අපේක්‍ෂා කරන අතර, ඒ සඳහා මා හට නියමිත සහයෝගය ලබා දෙනු ඇතැයි අපේක්‍ෂා කරමි. කාල සටහනෙහි නියමිත පරිදි නියමිත දිනට ඔබගේ අදහස් හා යෝජනා ලිඛිතව ලබා ගැනීමට ද මා අදහස් කර සිටිමි. සියළු දෙනාගේම දැන ගැනිම සඳහා මෙම මාණ්ඩලික පත්‍රය යොමු කරමි.

සභාපති,
උහන ප්‍රාදේශිය සභාව,
උහන.

## අයවැය කාල සටහන - 2023
## ප්‍රාදේශීය සභාව - උහන

| අනු අංකය | ක්‍රියාකාරකම්/පියවරයන් | අවසාන ඉලක්ක දිනය | වගකීම |
|---|---|---|---|
| 01 | මාණ්ඩලික පත්‍රය ඉදිරිපත් කිරීම | අගෝස්තු 09 | සභාපති |
| 02 | අයවැය සඳහා අදහස් ලබා ගැනීම. කොට්ඨාස කමිටු යෝජනා ඉදිරිපත් කිරීම. | අගෝස්තු 12 | සභාපති ඇතුළු මන්ත්‍රීවරුන්/ලේකම් ඇතුළු කාර්යය මණ්ඩලය/කමිටු සාමාජිකයින් |
| 03 | ආදායම් වියදම් පිළිබඳ ඒ ඒ අංශ වල වාර්තා ලබා ගැනීම. | අගෝස්තු 18 | අංශ ප්‍රධානින් හා විෂයය භාර නිළධාරීන් |
| 04 | මූලික ඇස්තමේන්තු සකස් කිරීම | අගෝස්තු 23 | අංශ ප්‍රධානින් හා විෂයය භාර නිළධාරීන් |
| 05 | මුදල් කමිටුවේ උපදෙස් ලබා ගැනීම | අගෝස්තු 25 | සභාපති ඇතුළු මන්ත්‍රීවරුන්/ලේකම් ඇතුළු කාර්යය මණ්ඩලය/කමිටු සාමාජිකයින් |
| 06 | අයවැය ප්‍රතිපත්ති තීරණය කිරීම හා සභාවට ඉදිරිපත් කිරීම | සැප්තැම්බර් 15 | සභාපති |
| 07 | අංශවල අයවැය ඇස්තමේන්තු සකස් කිරීම. | සැප්තැම්බර් 20 | අයවැය විෂයය භාර නිළධාරි /අංශ ප්‍රධානින් |
| 08 | අවසාන ඇස්තමේන්තු සකස් කිරීම හා අයවැය ලේඛනය කෙටුම්පත් කිරීම | සැප්තැම්බර් 30 | ලේකම්/ ප්‍රධාන කළමනාකරණ සහකාර/විෂය භාර නිලධාරී |
| 09 | අයවැය වාර්තාව කෙටුම්පත් කිරීම/ අයවැය පණිවුඩය සැකසීම | ඔක්තොම්බර් 02 | සභාපති/උප සභාපති/ලේකම්/ප්‍රධාන කළමනාකරණ සහකාර/අයවැය විෂයය භාර නිළධාරි |
| 10 | කෙටුම්පත් අයවැය ලේඛනය සභාවට ඉදිරිපත් කිරීම | ඔක්තොම්බර් 20 | සභාපති |
| 11 | අවශ්‍ය වේ නම් සංශෝධිත අයවැය ලේඛනය දෙවැනි වර සභාවට ඉදිරිපත් කිරි | නොවැම්බර් පළමු සතිය | සභාපති |
| 12 | අයවැය ලේඛනය මුද්‍රණය කර බෙදා හැරීම. | නොවැම්බර් 17 | ලේකම් |

සභාපති,
ප්‍රාදේශීය සභාව,
උහන.

**ගරු.ස.මන්ත්‍රී ඊ.ආර්.සුමනාවතී මිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා.**

ඉහත යෝජනාවට අනුව දින වකවානු දැමූ කාල සටහනක් ඇති බවත්,සැප්තැම්බර් 01 සිට නොවැම්බර් 17 දක්වා කාල පරාසය තුල මෙම කටයුතු සිදුකිරීමට සැලසුම් කර ඇති බවත්, එසේ ගිය වර්ෂයේදීද සැලසුම් කල බවත්,නමුත් එම සැලසුම් වැරදී ගිය බවත් ප්‍රකාශ කරන ලදි.සැලසුම වැරදීම නිසා ස්ථාවර තැන්පතු වලින් මුදල් ගැනීමට සිදුවූ බව පෙන්වා දෙන ලදි.එම සැලසුම් සකස් කිරීමට මෙම සභාවේ මුදල් කොපමණ වියදම් කර තිබෙනවාදැයි විමසන ලදි.අය වැය වාර්තාව සකස් කිරීම සඳහා නිළධාරීන්ට කොපමණ මුදල් ගෙවා තිබෙනවාදැයි විමසන ලදි.අය වැය සැකසීම සඳහා පුහුණු දීමනා මේ සභාවෙන් ගෙවා ඇති බව පෙන්වා දෙන ලදි.මේ කාල සටහනට අනුව අය වැය සකස්කිරීම සඳහා පුහුණු දීමනා ගෙවන බවද ප්‍රකාශ කරන ලදි. නැවත අය වැය සඳහා පුහුණු දීමනා නොගෙවන ලෙසද පෙන්වා දෙන ලදි. මෙම වර්ෂයේ සැලැස්ම නිවැරදිව කලයුතු බවත් අවිනිශ්චිත ආදායම් , අවිනිශ්චිත බැවින් අපි හදන්නේ

අවිනිශ්චිත කාලසටහනක් බැවින් ඉලක්ක ගත ආදායම අපට එකතු කර ගැනීමට බැරි වුව හොත් එතනින් එහාට අපි කොතනටද යන්නේ යන්න විමසන ලදි.එම නිසා සියලු පාර්ශව වල අනවශ්‍ය වියදම් අඩුකල යුතු බව පෙන්වා දෙන ලදි.මේ සඳහා හොද වැඩපිලිවෙලක් සකස්කල යුතු බවත් ,සභාවට ලැබෙන ආදායම් වැඩිකර ගන්නා වැඩ පිලිවෙලක් සකස් කලයුතු බවත් පෙන්වා දෙන ලදි.පක්ෂ පාට නොතකා සභාව ඉදිරියට ගෙනයන වැඩ පිළිවෙලක් සකස් කලයුතු බව පෙන්වා දෙන ලදි.නිවැරදි ඇස්තමේන්තුවක් ඉදිරිපත් කලයුතු බවද පෙන්වා දෙන ලදි.මේ ලේඛණය නිවැරදිව හැදිය යුතු බව පෙන්වා දෙන ලදි.නිවැරදි කල්පනාවෙන් කලයුතු බව පෙන්වා දෙන ලදි.

**ගරු සභාපතිතුමා.**

රංජිත් මන්ත්‍රීතුමා පෙන්වා දුන් කාරණාවල ලොකු හරයක් තිබෙන බවත් ,ගිය වර්ෂයේ මෝටර් ග්‍රේඩරයෙන් ආදායම් ලබා ගැනීමට හැකිවේවි යැයි සිතා ලක්ෂ 40 වැනි ප්‍රමාණයක් අයවැය සඳහා සදහන් කර තිබූ බවත් ,නමුත් ඉතා අනපේක්ෂිත ලෙස එම ආදායම් උපයා ගැනීමට නොහැකි වූ බවත් පෙන්වා දෙන ලදි.විශේෂයෙන් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයාගෙන් ඉල්ලීමක් කර සිටින බවත් ඔබතුමා මූල්‍ය ප්‍රතිපත්ති කමිටුවේ සිටි බවත් නමුත් ඔබතුමා එම කමිටුවෙන් ඉවත් වූ බවත් පසුගිය අයවැය ඡන්ද විමසීම් වලදී සමහර අවස්ථාවලදී විරුද්ධ වූ බවත් ,සමහර අවස්ථාවල කැමැත්ත ප්‍රකාශ කල බවත්,සමහර අවස්ථාවල නිහඩව සිටි බවත් පෙන්වා දෙන ලදි.එම නිසා මූල්‍ය ප්‍රතිපත්ති කමිටුව අගෝස්තු 25 වනදා රැස්වන බවත්,එම කමිටුවේ සිටින සියළුම සාමාජිකයන්ගෙන් අදහස් ලබා ගතයුතු බවත් ,ඔබ තුමා මෙම කමිටුවට පැමිණෙන ලෙස ප්‍රකාශ කරන ලදි.එසේම විමලරත්න මන්ත්‍රීතුමා එම කමිටුවට පැමිණෙන්නේ නොමැති නම් ඔබතුමාගේ යෝජනා තිබෙනවානම් ඒවා ලිඛිතව ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.මන්ත්‍රීවරුන් සඳහා ගමට වැඩ කිරීමට හැකි යම් මුදලක් ලබාදිය යුතු බැවින් ඔබතුමාලට ලබා දෙන රු.50000 ක මුදල රු.75000 දක්වා වැඩිකර ඇති බවත් ,එම මුදල් ලබා දීමට යම් වැඩපිලිවෙලක් දියත් කරමින් යන බවත් 2018 වර්ෂයේ මුද්දර මුදල් ඉල්ලා ඇති බවත්,එම මුදල් ලැබුණු පසු සියළුම මන්ත්‍රීවරුන්ට මුදල් ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදි.විශේෂයෙන්ම අයවැය ඉදිරිපත් කරන වේලාවේ ඕනෑම කෙනෙකුට රසබර කතාවක් කියන්නට පුළුවන් බවත් ,ආණ්ඩුව විවේචනය කරන්නට පුළුවන් බවත්,සභාපතිවරයා විවේචනය කරන්නට පුළුවන් බවත්,එම නිසා විවේචනය කරනවාට වඩා තව මාස දෙකක් ඇති බැවින් ඔබගේ අදහස් අපට ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදි.රංජිත් මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට කඩකුලී,ව්‍යාපාර බදු,වරිපනම් මුදල් වැඩිකල යුතු බවත් ,එසේ සිදුකර හෝ ආදායම් වැඩිකර ගතයුතු බව පෙන්වා දෙන ලදි.එමනිසා සියළු මන්ත්‍රීවරු එකතු වී මෙම අයවැය සකස් කිරීමට සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මහතා.**

රංජිත් ඒකනායක මන්ත්‍රීතුමා අදහසක් ඉදිරිපත් කල බවත්,දැනට රටේ පවතින තත්වය හේතුකර ගෙන ප්‍රා.ස.අදායම් පහල බසින නිසා ඉදිරි අයවැය සකස් කිරීමේදී ආදායම් උපයන ක්‍රමයක් ලෙස ව්‍යාපාර බදු වැඩිකරන යෝජනාවකට යෑම සුදුසු බව එතුමා පෙන්වා දුන් බව ප්‍රකාශ කරන ලදි.මේ උද්ධමනය එක අංශයකට පමණක් නොව සෑම අංශයකටම බල පෑ කාරණාවක් බවත්,එදිනෙදා කුලී වැඩ කරන සාමාන්‍ය පුද්ගලයන්ගේ සිට මහා පරිමාණයෙන් වැඩ කරන ව්‍යාපාරිකයා දක්වාම එය බල පෑ බවත් පෙන්වා දෙන ලදි.සියළුම ව්‍යාපාර කටයුතු හා දෛනික කටයුතු මේ මොහොත වන විට අඩාල වී ඇති බවත්,එම නිසා සභාවේ ආදායම ඉහල නංවා ගැනීම උදෙසා මේ මොහොතේ ව්‍යාපාර බදු ඉහල දැමීමක් සිදු කල හොත් ව්‍යාපාර කරන පුද්ගලයින්ට දරා ගැනීම අපහසු වන බවත්,බැංකු වල පසුගිය කාලයේ ණය සහන ක්‍රම තිබූ බවත් ,එම ණය සහන ක්‍රමය ඉවත් කර පොලී අනුපාත වැඩිකර ඇති බවත් ,අළුතින් ණය නිකුත් කිරීම නතර කර ඇති බවත්,එවැනි කාරණා සමග ගත්විට ව්‍යාපාරිකයින් බොහෝවිට හිර වී ඇති බවත් පෙන්වා දෙන ලදි.මේ ක්‍රියාවලිය තුල ව්‍යාපාර කටයුතු අඩාල වී ඇති බවත් ,එවැනි කාල වකවානුවක සභාවේ ආදායම ඉහළ නංවා ගැනීමට ව්‍යාපාර බදු ඉහළ දැමීම සිදු කිරීම සම්බන්ධව තව කිහිප වතාවක් සිතා බැලිය යුතු බව පෙන්වා දෙන ලදි.අපේ ප්‍රාදේශිය සභාව නඩත්තු වන්නේ ප්‍රදේශයේ ඇති ව්‍යාපාර වලින් ලැබෙන ආදායම් හේතු කොට ගෙන බවත් පෙන්වා දෙන ලදි. සභාවේ වියදම් කපා හැරිය යුතු බවත් ,මා දකින ආකාරයට රජයේ ආයතන වල වියදම් අඩු කරන ක්‍රම වේද සිදු වූවාද නැද්ද යන්න ප්‍රශ්නයක් බවත් පෙන්වා

දෙන ලදි.එසේ වියදම් අඩු කිරීමක් සිදු වූවා නම් ජනතාවට එය පෙන්විය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.රටේ සියළුම ආයතන සම්බන්ධව මෙය ප්‍රකාශ කරන බවද පෙන්වා දෙන ලදි.ඒ ආකාරයට ගත්විට ප්‍රාදේශීය සභාවක් ලෙස අප ආදර්ශමත් වියයුතු බවත්,වෙනත් අයගේ බදු මුදල් වැඩි කිරීමට වඩා සභාවේ වියදම් අඩු කිරීම තුළින් අපි පැහැදිලි කැපී පෙනෙන නියමු ව්‍යාපෘතියක් කලයුතු බව ප්‍රකාශ කරන ලදි.අද දිනයේ සිට අප දිනයක් යොදා මාස 06 කට හෝ දෙසැම්බර් මාසයේ අයවැය වන විට හෝ අපේ වියදම මෙච්චර ප්‍රමාණයක් අඩුකර ගෙන තිබෙන බව පෙන්වීමට හැකිනම් එය ඉතා සුදුසු බවත්,අද මේ කතා කරන දේ ක්‍රියාත්මක විය යුතු බවත් ,නැතිනම් ලබන සබා වාරයේදීත් මෙය කතා කරන්නට සිදුවන බවත් ප්‍රකාශ කරන ලදි.කොපමණ වැදගත් යෝජනාවක් ගෙන ආවත් ඒවා ක්‍රියාත්මක වනවා නොපෙනෙන බවත් , අනිත් මන්ත්‍රීවරු මම කියන දේ අනුමත කරනවා නම් අපේ පැත්තෙන් අපි පැහැදිලිවම අපේ වියදම් අවම කලයුතු බවත් ,සභාපතිතුමාගේ සිට පහල සේවකයා දක්වාම සභාව තුළින් අප කරන වියදම් පැහැදිලි අඩු කිරීමක් කලොත් ,එය නිවැරදි බවත්, මේ මොහොතේ සිදු නොකල යුතු දේවල් සිදු කරන බව අප දකින බවත්,එවැනි දේ හඳුනාගත යුතු බවත් ,මෙය චෝදනාවක් නොවන බවත් ,අදහසක් පමණක් බවත් පෙන්වා දෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.20 ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්.චමින්ද පුෂ්ප කුමාර මහතා පැමිණෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.බී.විමලරත්න මහතා.**

අද දින සභාවට පැමිණීමට හැකි තත්වයක නොසිටි බවත් නමුත් පසුගිය වාර්තාව කියවූ පසු අද දින සභාවට පැමිණීමට ධෛර්යයක් පැමිණි බවත්,නමුත් න්‍යාය පත්‍රයට පිටින් කතා කිරීමට බලාපොරොත්තු නොවන බවත් ප්‍රකාශ කරන ලදි. කෙසේ නමුත් ඔබතුමා දෙතුන් පාරක්ම මාගේ නම කියා ආරාධනා කල බැවින් ඒ ආරාධනය පිළිබඳ මා ස්තුතිවන්ත වන බවත් ප්‍රකාශ කරන ලදි. නමුත් රංජිත් මන්ත්‍රීතුමා ප්‍රකාශ කල පරිදි අපට මහා ලොකු කාලයක් මේ සභාවේ ගෙවා ගැනීමට නොමැති බවත් ,ඒ නමුත් මේ සභාවට කවුරුන් හෝ පැමිණෙනවා නම් ඒ සභාපතිතුමා ගැන සිතා ,මන්ත්‍රීවරු ගැන සිතා ,නිළධාරීන් ගැන සිතා,අයවැය සකස් කිරීමට අප විසින් විධිමත් වැඩපිළිවෙලක් සකස්කර ගතයුතු බව පෙන්වා දෙන ලදි.නමුත් කණගාටුව වන්නේ අද දිනය වන විට දැවැන්ත ආර්ථික අර්බුදයක් , දැවැන්ත දේශපාලන අර්බුදයක්, වාගේම දැවැන්ත සාමාජීය අර්බුදයක් පත්වෙලා තිබෙන මොහොතක මාණ්ඩලික පත්‍රය ගැන අප විසින් කතා කරන බවත් ,ඒ කෙසේ වෙතත් මීට අවුරුදු හතරහමාරකට පෙර මේ සභාවට අපි පැමිණි බවත්,මේ සභාවට පැමිණි පසු ඔබතුමාට මතක නම්, එසේම මේ සභාවේ සිටින මන්ත්‍රීවරුන්ට මතක නම් , පරණ සභා වාර්තා කියවා බැලූ පසු ඔබට තේරේවි මම මේ අනතුර දැක්ක බව.මේ අනතුර දුටු නිසා මම යෝජනා විශාල වශයෙන් මේ සභාවට ඉදිරිපත් කල බවත් පෙන්වා දෙන ලදි.එසේම විශාල වශයෙන් ප්‍රශ්න ප්‍රමාණයක් සභාපතිවරයාට ඉදිරිපත් කල බවත් , විශාල සංදේශ ප්‍රමාණයක් සභාපතිවරයාට ඉදිරිපත් කල බවත්, නමුත් තවමත් පිළිතුරු නොදුන්න ප්‍රශ්න රාශියක් තිබෙන බවත් ප්‍රකාශ කරන ලදි.ඒවා සොයා බලා කියවා බලන ලෙස ප්‍රකාශ කරන ලදි.නමුත් මම ඒ ප්‍රශ්න ඉදිරිපත් කරන විට ,සභාවේ ප්‍රශ්න කරන විට එදා මම දෙස සභාවේ මන්ත්‍රීවරු අවඥාවෙන් බැලූ බව ප්‍රකාශ කරන ලදි.ලඟ සිටින මන්ත්‍රීවරයාට කතා කොට සිනා සී අප්‍රදාදය එල කල බව ප්‍රකාශ කරන ලදි.උහන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආදායම් උත්පාදන මාර්ග නැතිව නොවන බවත්,අනෙකුත් ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශ වලට වඩා මහා දැවැන්ත ආදායම් ක්‍රමෝපායන් අප සතු කර ගැනීමට තිබූ බව ප්‍රකාශ කරන ලදි. නමුත් ඒවාට යෝජනා ඉදිරිපත් කරන විට ,ප්‍රශ්න ඉදිරිපත් කරන විට ගොඩක් අවස්ථාවල ඒවා සම්මත වූ බවත් ,සම්මත නොවූවා කියන එක අමතක බවත් පෙන්වා දෙන ලදි.පුංචි උදාහරණයක් මෙම සභාවේදී සාකච්ඡාවේදී වැලි තොටුපලවල් ගැන කතා කල බව සභාවේ සියළුම දෙනාට මතක ඇති බව ප්‍රකාශ කරන ලදි.වැලි යනු මහා කර්මාන්තයක් බවත් , පරිසරය විනාශ නොකර මේ සභාවට සෘජුවම ආදායම් ලබා ගන්නට පුළුවන් මහා දැවැන්ත වැලි කර්මාන්තයක් උහන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තිබෙන බවත් ප්‍රකාශ කරන ලදි.එදා මා විසින් එම යෙජනාව සභාවට ඉදිරිපත් කැන විට ඔබතුමාලා විසින් දැනටමත් වැඩපිළිවෙලක් සකස් කර තිබෙන බව පවසා සිටින ලදි. මැෂින් එකක් ගෙන පැකට් කර වෙළඳ පොළට නිකුත් කිරීමට කටයුතු යොදා තිබෙන බව ඔබතුමා විසින් පවසා සිටි බව ප්‍රකාශ කරන ලදි.අවුරුදු හතරහමාරක් තිස්සේ එම කටයුත් කර ගැනීමට නොහැකි වූ බවත් එයින් අපේ අකාර්යක්ෂමතාවය පිළිබිඹුවන බව පෙන්වා දෙන ලදි.නමුත්

පෞද්ගලික අංශයක කෙනෙක් මේ සඳහා යොමු වූවානම් සතියෙන් දෙකෙන් මෙම කාර්ය කරගන්නා බව පෙන්වා දෙන ලදි.

**ගරු සභාපතිතුමා.**

ඔබතුමාට බාධා කරනවා නොවන බවත් ,එම වැලි සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ලිපි ලේඛන භාර දී ඇති බවත් නමුත් ඒ සඳහා ව්‍යාපාර ලියාපදිංචිය එක දීම ප්‍රමාද වීම නිසා තවම එය අතර මග නැවතී තිබෙන බව පෙන්වා දෙන ලදි.පුද්ගලික අංශයට බිස්නස් රිජිස්ටේෂන් එක ඉක්මනින් ලබා දෙන බවත්, ආයතනයක් ලෙස ව්‍යාපාර ලියාපදිංචිය එකක් ගැනීමට යාමේදී ගැටළු රාශියක් තිබෙන බව පෙන්වා දෙන ලදි.එම නිසා ව්‍යාපාර ලියාපදිංචිය එක නොමැතිව එය ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොමැති බව පැහැදිලි කර දෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.බී.විමලරත්න මහතා.**

නැවත දිනයකදී ,වැවේ ගම වැව ගොඩ දමන එක සම්බන්ධව යෝජනාවක් ගෙන ආ බව ඔබතුමාට මතක ඇති යැයිද ප්‍රකාශ කරන ලදි.වැවේ ඇති පස් කපන එක සම්බන්ධව පසු කාලීනව ඔබතුමා ප්‍රකාශ කලේ ඒ වැව හාරන එක නිසා දැවැන්ත ප්‍රශ්නයක් පැන නැගී ඇති බවයි.ඒ මඩ ආදල්ඔයට එකතු වන බව ඔබතුමා ප්‍රකාශ කල බවත්,ඒක පරිසර හානියක් බවත් ප්‍රකාශ කරන ලදි.මම මේවා මතක් කරමින් පෙන්වීමට උත්සාහ ගන්නේ එම යෝජනා ක්‍රියාත්මක කර ගැනීමට නොහැකිව අවුරුදු හතරහමාරක් ගොස් තිබියදී අපි හිර වෙලා නම් අපි ආදායම් හොයන්නේ කෙසේදැයි විමසන ලදි.එදා ඉදිරිය දැකපු නිසා යෝජනා ගෙන ආ බවත් , මේ යෝජනා පමණක් නොව විශාල වශයෙන් යෝජනා ඉදිරිපත් කල බව ප්‍රකාශ කරන ලදි.නැවත ආපස්සට හැරී බැලුවොත් මේ සභාවට ආදායම් ගෙන ඒම සඳහා කරපු යෝජනා විශාල වශයෙන් ඇති බවත්, නමුත් එම යෝජනා සියල්ලම කුණු ගොඩට ගොස් ඇති බව ප්‍රකාශ කරන ලදි.කර්මාන්ත ක්ෂේත්‍රයක් පනතේ ඇති බවත් ,ඒවාට සම්බන්ධ වන්නේ කෙසේදැයි පනතේ ඇති බවත්,අපි ආදායම් සොයන්නේ කෙසේදැයි පනතෙන් ඉඩකඩ සලසා ඇති බවත් පෙන්වා දෙන ලදි.නමුත් අපි ඒ සඳහා යොමු වූවාද නැද්ද යන්න අපට දැනෙන බවත් ,එසේ නොකරපු නිසා එය හොඳින් දැනෙන බවත් පෙන්වා දෙන ලදි.ගිය සභාවේදී උප සභාපතිතුමා ඒ සම්බන්ධව ලොකු කතාවක් කර ඇති බවත් ,එය වාර්තාවේ සඳහන් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදි. උප සභාපතිතුමා එය හොඳින් දැක ඇති බවත්, එය දුටුව නිසා එතුමා ගිය සභා රැස්වීමේදී තමන්ට තිබෙන වේදනාව ,මේ සභාවේ ආදායම් අහිමි වීම සම්බන්ධව වේදනාව සහ වියදම් පැත්තේ වැඩිවීම සම්බන්ධව වේදනාව, මේ වාර්තාවේ සඳහන් වී තිබූ බව පෙන්වා දෙන ලදි.එතුමාට මේ සම්බන්ධව යම් කාර්යයක් , උත්සාහයක් තිබෙන්නට ඇති බවත් ,මේ තත්වයෙන් මුදවා ගැනීමට එතුමා යම් උත්සාහයක් ගන්නට ඇති බවත් ප්‍රකාශ කරන ලදි.මේ සම්බන්ධව එතුමාට ස්තුතිවන්ත වන බවත් ප්‍රකාශ කරන ලදි.මේ මාසයේ 12 වනදා වනවිට අපට යෝජනා ලබාදිය හැකි බවත්, ආදායම් ගෙන ඒමේ යෝජනා ලබාදිය හැකි බවත් ,රංජිත් මන්ත්‍රීතුමාගේ කතාවට මා එකඟ වන බවත්,2023 වර්ෂයේ අපට තිබෙන ආදායම් කොපමණද , ඉලක්කම් වලින් හදන ආදායම නොව ඉලක්ක ගත ආදායම කොපමණද යන්නත් , මේ රටේ තිබෙන අර්බුදයත් සමග වියදම් වැඩි වූවාට , බදු මිල වැඩි වූවාට , තෙල් මිල වැඩි වූවාට , ආදායම වැඩි නොවුනු බවත් පෙන්වා දෙන ලදි.එම නිසා අප විසින් පලමුවෙන්ම ආදායම ඉලක්කගත කලයුතු බව පෙන්වා දෙන ලදි.ආදායමට සාපේක්ෂව වියදම් ටික සකස් කල යුතු බව පෙන්වා දෙන ලදි.මේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය ගත්විට මහා පිම්මක් පනින්නට අපට නැති බවත් මට දැනෙන ආකාරයට අපගේ වියදම් අඩුකල යුතු බවත් , දෙලංකාවල මන්ත්‍රීතුමා පවසා සිටි ආකාරයට අපට ව්‍යාපාර බදු වැඩි කරන්නට හැකියාවක් නොමැති බව ඇත්ත බවත් , ව්‍යාපාර බදුවැඩි කරන විට එහි අප්‍රසාදය පැමිනෙන්නේ සභාපතිතුමාට බවත් පෙන්වා දෙන ලදි.එම නිසා ඒ තුලින් දැවැන්ත ආදායමක් ලබා ගැනීමට හැකියාවක් ලැබෙයැයි විස්වාස නොකරන බවත්,අපට කර්මාන්ත ආදායම පැත්තට නොගොස් විශාල වශයෙන් ආදායම වැඩි කර ගැනීමට හැකියාවක් නොපවතින බව පෙන්වා දෙන ලදි.එසේම අපට ඉතා ඉක්මනින් ඒ පැත්තට යාමට හැකියාවක් ඇති යැයි විස්වාස නොකරන බවත් පෙන්වා දෙන ලදි.තව අපට බොහොම කෙටි කාලයක් පමණක් තිබෙන බවත් , සැප්තැම්බර් වලින් පසු සභාව විසුරුවා හරින්නටත් පුළුවන් බවත් , අප ඒ පිළිබඳව නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදි.ඒ කෙසේ

වෙතත් අළුතින් එන අය සඳහා මෙය අපි සාදා තබා යායුතු බවත් ,ලස්සනට හදා තබා යායුතු බවත් , හිටපු අය ලස්සනට හදලා තියලා ගියායැයි පැවසිය හැකි ආකාරයට යායුතු බව ප්‍රකාශ කරන ලදි.එම නිසා ආදායම් ප්‍රමාණය බලා අපගේ වියදම සකස් කලයුතු බව ප්‍රකාශ කරන කරන ලදි.අපේ මේ ඇතුලේ තිබෙන පරිභෝජන රටාව වෙනස්කර නොගතහොත් විශාල ගැටළු රාශියකට මුහුණ දීමට සිදුවන බව පෙන්වා දෙන ලදි.පසුගිය මස සභාවාරයේදී ස්ථාවර තැන්පතුවෙන් මුදල් ලබා ගැනීමට අනුමැතිය ඉල්ලා ඇති බවත්, ඒ සඳහා රංජිත් මන්ත්‍රීතුමා හැර සියළුම මන්ත්‍රීවරු කැමැත්ත ලබා දී ඇති බවත් , ඒ යෝජනාව සඳහා රංජිත් මන්ත්‍රීතුමා පමණක් විරුද්ධ වී ඇති බවත් , මම එම සභා වාරයේ සිටියානම් මමත් එයට විරුද්ධව ඡන්දය ලබා දෙන බව ප්‍රකාශ කරන ලදි.ඒ පිළිබඳ රංජිත් මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වන බව ප්‍රකාශ කරන ලදි.මේ මාස කිහිපයේ වියදම වැඩි වී තිබෙනවානම් එම වියදම් ප්‍රමාණය උපරිමව අඩු කරගත යුතු බව ප්‍රකාශ කරන ලදි.එසේ වියදම් අඩු කිරීම තුලින් යම් මුදල් ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමට බලාපොරොත්තු විය යුතු බව ප්‍රකාශ කරන ලදි.එසේම සභාපතිතුමා ඉල්ලා සිටි කාරණාව සම්බන්ධව සිතා බැලිය යුතු බවත්, මුදල් කමිටුවට පැමිණෙනවාද යන්න සිතා බැලිය යුතු බව ප්‍රකාශ කරන ලදි.මොකද මේ අවුරුදු 04 පුරාවටම මුදල් හා පුතිපත්ති කමිටුවට පැමිණියා කියා විශාල දෙයක් සිදු නොවුනු බවත් ,එසේ සිදුවනවා නොදුටු බවත් පෙන්වා දෙන ලදි.මම වාර්තාව කියවලා පැමිණි බවත් , ඒ සම්බන්ධව කතා කිරීමට අවස්ථාවක් මේ සභාවෙන් නොලැබෙන බවද දන්නා බව ප්‍රකාශ කරන ලදි.එහෙම දෙයක් කතා කිරීමට අවස්ථාව ඉල්ලා නොසිටින බවත් , නමුත් යම් මොහොතක ඉඩකඩ ලැබුනොත් ඒ වාර්තාවේ ඇති කරුණු කාරණා සම්බන්ධව කතා කරන බව ප්‍රකාශ කරන ලදි.මම මේ සභාවට පැමිණි දවසේ සිට කියා සිටින්නේ දේශපාලන පක්ෂ පාට භේදයකින් තොරව වැඩ කලයුතු බවයි.

**ගරු සභාපතිතුමා.**

ඔබතුමා අයවැයට විරුද්ධව ඡන්දය දුන්නාට විමධ්‍යගත මුදල වන රු.50000.00 ක මුදල ලබා දුන් බවත් එම මුදල් වල යෝජනා තවම ඔබතුමාට ක්‍රියාත්මක කර ගන්නට බැරි වූ බවත් , එම රු.50000.00 වියදම් කර ඔබතුමාගේ යෝජනා ක්‍රියාත්මක කර ගන්නට බැරිව ,ආදායම් උත්පාදන යෝජනා සභාවට ඉදිරිපත් කර වැඩක් නැති බව පෙන්වා දෙන ලදි.කියවීමේ පොත් පුස්තකාලයට ලබා දීම හා දේශකයෙක් කැඳවා දේශනයක් කිරීම ආදී යෝජනා දී ඇති නමුත් තවම එය ක්‍රියාත්මක කර ගන්නට බැරි වූ මන්ත්‍රීවරයෙක් ලෙස මා ඔබතුමාව දකින බව ප්‍රකාශ කරන ලදි.ඔබතුමා චෙක් පතක් මගින් ඔබතුමාගේ දීමනාව පක්ෂ මූලස්ථානයට ලබා දී නැවත එතනින් එම රු.15000.00 ගන්නවානම් විහිළු සපයන මන්ත්‍රීවරයකු ලෙස හැසිරෙන්නට එපා යැයි පවසා සිටින ලදි.චෙක් පතකින් දීමනාව ලබා දීම සභාවට තවත් වියදමක් එකතු වීමක් බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා.**

විමලරත්න මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට ආදායම් උත්පාදනය ගැන කතා කිරීමේදී පැල තවාන පිළිබඳ කතා කලයුතු බවත් , එය විශාල ආදායමක් එන ව්‍යාපෘතියක් බව පෙන්වා දෙන ලදි.වෙළඳ බදු පිළිබඳ සභාවෙන් තීන්දුවක් ගත්තත් නියම කල හැකි උපරිම මිලක් තිබෙන බවත් , ඉන් එහාට යාමට නොහැකි බවත් පෙන්වා දෙන ලදි.දෙලංකාවල මන්ත්‍රීතුමා පැවසූ පරිදි පොඩි මිනිසාට මෙය දරන්නට නොහැකි බව පිලිගන්නා බවත් , නමුත් උත්පාදනය කර ගැනීමට නොහැකි වුවහොත් සභාව අකර්මණ්‍ය විය හැකි බවත් පෙන්වා දෙන ලදි.වියදම් අවම කිරීම අනිවාර්යයෙන් සිදු විය යුතු බව පෙන්වා දෙන ලදි.

**ගරු උප සභාපති එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මහතා.**

ගිය වර්ෂයේ අයවැය සැකසීම වගේම මේ වර්ෂයේ අයවැය සැකසීම සම්බන්ධව කතා කිරීමේදී මන්ත්‍රීවරුන්ගේ යෝජනා අරගෙන නිළධාරීන් අයවැය ලේඛණය සකස් කරන බවත්,එක් වර්ෂයක අයවැයක් සකස්කිරීමේදී මා සහ දෙලංකාවල මන්ත්‍රීතුමා ළඟින්ම සිට වෙනස් කර කර හැදූ බවත් , බොහෝ වේලාවට කරන්නේ මේ අවුරුද්දේ අයවැය බලා අංකමය වෙනසක් සිදු කිරීම බවත් පෙන්වා දෙන ලදි.එය මේ වර්ෂයේ වෙනස්කර ගිය අවුරුද්දට සාපේක්ෂව ආදායම් වියදම් ගලපා නිවැරදිව අයවැය කෙටුම්පත් කර ඉදිරිපත් කිරීම සිදුවනවා නම් ඉතාම සුදුසු බව පෙන්වා දෙන ලදි.විමලරත්න මන්ත්‍රීතුමා

සාධනීය යෝජනා පැමිණි විට ඒවාට සහයෝගය එතුමාගේ පක්ෂය වෙනුවෙන් ලබා දෙන බවත් , නමුත් අවුරුදු හතරේදීම අයවැය ලේඛණය ඉදිරිපත් කරන අවස්ථාවේ ඒ සඳහා ඡන්දය ලබා නොදුන් බවත් , අයවැය හොඳ නැතිනම් එම අයවැය හොඳ වීම සඳහා අදහස් ලබා දිය යුතු යැයි ප්‍රකාශ කරන ලදි.එම අයවැය හොඳ නැති වූවාට එය මගින් වෙන් කරනු ලබන රු.50000.00 ක මුදල ලබා ගන්නා බව ප්‍රකාශ කරන ලදි. ගමට ප්‍රදේශයට යම් කාර්යයක් කිරීමට ලබා දෙන එම මුදල ලබා ගන්නා බව පෙන්වා දෙන ලදි.අයවැයට ඡන්දය ලබා දෙන්නේත් නොමැතිනම් සාධනීය දෙයට උදව් කරනවා යනුවෙන් ප්‍රකාශ කර සිටින්නේ කුමක්දැයි විමසන ලදි.අවුරුද්දක් පමණ යනතුරු මා විසින් දුරකතන දීමනාව ලබා නොගත් බවත් , මේ මන්ත්‍රීවරු කිසිම වියදමක් අඩුකර ගැනීමට සහයෝගය ලබා නොදෙන බව හැඟීගිය පසු මම විතරක් දුරකතන දීමනාව ලබා නොගෙන සිටින්නේ මන්දැයි සිතුන බවත් , පසුව මාස දෙක තුනක් නැවත දුරකතන දීමනාව ලබාගත් බවත් , නමුත් එම දීමනාව ලබා ගෙන වචන අසන්නේ කුමකටදැයි නැවත සිතුන නිසා එය ලබා නොගත් බවත් පෙන්වා දෙන ලදි.මාස හය හතකට වඩා දුරකතන දීමනාව ලබා නොගත් බව පෙන්වා දෙන ලදි.සභාවෙන් යැයි ලබා ගන්නා දීමනාව යම් කිසි පොදු වැඩකට යෙදවූ බව ප්‍රකාශ කරන ලදි.මට ඒවා ඔප්පුකර පෙන්විය හැකි බව ප්‍රකාශ කරන ලදි.විමලරත්න මන්ත්‍රීතුමා හොඳ යෝජනා සභාවට ඉදිරිපත් කලබව අවිවාදයෙන් යුතුව පිලිගන්නා බව ප්‍රකාශ කරන ලදි.එතුමා යෝජනා 150 පමණ ඉදිරිපත් කල බවත් ,එම යෝජනා වලින් එක යෝජනාවක් වත් ක්‍රියාත්මක කර නොමැති බවත් ප්‍රකාශ කරන ලදි.ස්ථාවර තැන්පතුවෙන් මුදල් ලබා ගැනීමේ යෝජනාවට විමලරත්න මන්ත්‍රීතුමා සිටියානම් විරුද්ධවන බව පවසා සිටිය බවත් , අපේ හෘදසාක්ෂියත් එසේ පැවසූ බවත්, නමුත් අප ගෙදර යනවිට සභාව ණයකර යෑමට නොහැකි නිසා එයට එකඟ වූ බව ප්‍රකාශ කරන ලදි.එසේම ඔබතුමා කියන ආකාරයට අනවශ්‍ය වියදම් මේ සභාවේ තිබෙන බවත් එම අනවශ්‍ය වියදම් නතර කිරීමේ හැකියාව සභාපතිතුමාට සහ ලේකම්තුමියට තිබෙන බවත් පෙන්වා දෙන ලදි.ඒවා නතර නොකර ඉදිරියට ගෙන යාමේ ප්‍රතිඵලය තමන්ගේ ගිණුමට බැර වන බවත් , වියදම් කළමනාකරණය කලයුතු බවත් ,ඒවා කළමනාකරණය කිරීමට සභාපතිවරයෙක් හා මන්ත්‍රීකණ්ඩායමක් හා ලේකම්වරියක් සිටින බව පෙන්වා දෙන ලදි. අයවැය සම්බන්ධව කතා කිරීමේදී රංජිත් මන්ත්‍රීතුමා ,විමලරත්න මන්ත්‍රීතුමා, දෙලංකාවල මන්ත්‍රීතුමා පැවසූ පරිදි ,මිනිසුන් තලා පෙලන්නේ නැතිව අදායම වැඩිකර ගන්නා ආදායම් මාර්ග ඕන තරම් තිබෙන බව සත්‍යයක් බව ප්‍රකාශ කරන ලදි.ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය ගත්විට උහන යනු සම්පත් විශාල වශයෙන් තිබෙන ප්‍රදේශයක් බවත් එම සම්පත් යොදා ගෙන එක එක යෝජනා පැවති බවත් එම යෝජනා ක්‍රියාත්මක කලානම් සභාවේ ආදායම වැඩිකර ගැනීමට හැකියාව තිබූ බව පෙන්වා දෙන ලදි.මේ තිබෙන තත්වය උඩ කිසිම ආණ්ඩුවකින් ආධාරයක් අරගෙන වැඩ කරනවායැයි සිතා අයවැය හැදිය නොහැකි බවත් පෙන්වා දෙන ලදි.මිනිසුන්ව තලා පෙලා ආදායම් ලබා ගැනීමට වඩා අප සභාව සතුව වෙනත් ආදායම් මාර්ග තිබෙන බවත් , හිමිදුරාව වැව ගැන හා රජගල කන්ද ගැන කතා වූ බවත් ඒවායින් ආදායම් උත්පාදන මාර්ග සාදා ගත හැකි බවත් පෙන්වා දෙන ලදි.රජගල කන්ද ගත්විට පුද්ගලයින් පුද්ගලිකව ඒ තුලින් ආදායම් උපයා ගන්නා බව පෙන්වා දෙන ලදි.රජගල කන්ද නැරඹීම සඳහා විශාල පිරිසක් පැමිණෙන බවත්,රු.10 ක හෝ ටිකට් එකක් කඩා එය නැරඹීමට සැලැස්සුවානම් එය සභාවට ආදායමක් බව පෙන්වා දෙන ලදි.අරහෙන් මෙහෙන් ආදායම් එනතුරු බලානොසිට ආදායම් උත්පාදන මාර්ග සැදිය හැකි බව පෙන්වා දෙන ලදි.මෝටර් ග්‍රේඩරය හා JCB යන්ත්‍රය දෙස බලා ඊලඟ අයවැය සකස් කල නොහැකි බව පෙන්වා දෙන ලදි.සංවර්ධන වැඩ කටයුතු ලබන අවුරුද්දේ කුමන කාලයක පටන් ගනීවිදැයි නොදන්නා බව ප්‍රකාශ කරන ලදි.ඉදිරි අයවැය සැකසීම සම්බන්ධව කාලසටහනක් දමා ඇති බවත් ,එය නිකම්ම නිකම් කාලසටහනක් නොකර නිවැරදි ක්‍රමවේදයකට යමින් කටයුතු කිරීම සිදුවිය යුතු බව පෙන්වා දෙන ලදි.සභාපතිතුමා හා ලේකම්තුමිය මැදිහත් වී සියළුම මන්ත්‍රීවරුන්ගෙන් හා කාර්ය මණ්ඩලයෙන් අදහස් අරගෙන එයින් හොඳ අදහස් ක්‍රියාත්මක කර ආදායම් උත්පාදන මාර්ග සකස් කිරීම සිදු කිරීම විය යුතු බව පෙන්වා දෙන ලදි.වියදම් අඩු කර ගැනීමට ක්‍රමවේද සකස්විය යුතු බව පෙන්වා දෙන ලදි.නිළධාරීන්ගේ අතිකාල දීමනා ගෙවීම සිදු නොකරන ලෙසද පෙන්වා දෙන ලදි.සත්‍ය වශයෙන්ම වැඩ කරනවානම් පමණක් අතිකාල දීමනා ගෙවන ලෙසද ප්‍රකාශ කරන ලදි.සමහර කාර්යයන් ගැන සතුටක් තිබෙන බවත් මේ අවුරුදු හතරහමාර තුල අප හොඳ වැඩ කොටසක් කල බවත් ප්‍රකාශ කරන ලදි.

**ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්.චමින්ද පුෂ්ප කුමාර මහතා.**

අයවැය සම්බන්ධ මාණ්ඩලික පත්‍රය ගැන කතා කිරීමේදී අයවැය සඳහා අපේ මන්ත්‍රීවරු මීට ප්‍රථම යෝජනා ලබා දුන් බවත් , හොඳ යෝජනා රාශියක් ගෙන ආ බවත් රංජිත් මන්ත්‍රීතුමා සර්විස් සෙන්ටර් එකක් දැමීම සම්බන්ධව යෝජනා ගෙන ආ බවත් විමලරත්න මන්ත්‍රීතුමාද හොඳ යෝජනා ගෙන ආ බවත් ප්‍රකාශ කරන ලදි.නමුත් එම යෝජනා මේ අවුරුදු හතර තුල ක්‍රියාත්මක කිරීමට බැරි වූ බව ප්‍රකාශ කරන ලදි.සභාවක් ලෙස එම යෝජනා ක්‍රියාත්මක කිරීමට හා මුදල් උපයන ක්‍රමවේදයක් සකස් කර ගැනීමට බැරි වූ බව ප්‍රකාශ කරන ලදි.නමුත් දැන් ඒවා ක්‍රියාවට නංවන්නට හදනවානම් එය බොරුවක් බවත් පෙන්වා දෙන ලදි.මෙපමණ කාලයකට ක්‍රියාත්මක කරන්නට බැරිවුනු දේවල් පොඩි කාලයකදී ක්‍රියාත්මක කරන්නට නොහැකි බව පෙන්වා දෙන ලදි.එසේම විමලරත්න මන්ත්‍රීතුමාගේ අදහස ගැන කතා කලයුතු බවත් ,හේතුව එතුමා මෙම යෝජනා සඳහා මෙවර අයවැයේදී පමණක් නොව මීට ප්‍රථමවද කවදාවත් පක්ෂව ඡන්දය ලබා දී නොමැති බව පෙන්වා දෙන ලදි.එසේම හොඳ යෝජනාවක් හෝ අදහසක් ගෙන ආවොත් එයට සාධනීය තත්වයක් නොලැබෙන බවත්,එය පක්ෂ ප්‍රතිපත්තියද කියා නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදි.නමුත් අපි පක්ෂයේ ප්‍රතිපත්ති වෙලාගෙන දැන් සිටියා ඇති යැයි මට හිතෙන බවත් ,ඔබතුමා හා ඔබතුමාගේ පක්ෂය මේ රට ගැන හා ජනතාව ගැන සිතනවානම් සභාවේ දේවල් වලටවත් සහයෝගය ලබා දී නොමැති බවත් , හැම වේලාවේදීම ප්‍රතික්ෂේප කරන බව පෙන්වා දෙන ලදි.ඔබතුමා ප්‍රකාශ කරන ආකාරයට ඔබතුමා කිසිම යෝජනාවක් සම්මත කරගන්නට කිසිම ආකාරයක සහයෝගයක් ලබා දී නැති බව මා ප්‍රකාශ කරන බව පැහැදිලි කරන ලදි.ඔබතුමාගේ පක්ෂය ගැන බොහොම කණගාටුවෙන් කතා කරන බවත් ,අද රට වැටිලා තිබෙන ආර්ථික අගාධය හා ජනතාව පීඩා විඳින තත්වය විඳ දරා ගන්නට බැරිව රට දේශපාලනික වශයෙන් හා ආර්ථික වශයෙන් විශාල අර්බුදයකට මුහුණ පා සිටින බවත් , නමුත් ප්‍රා.ස. ලෙස පුංචි තැනින් අපට කරන්නට පුළුවන් යම් මෙහෙවරක් තිබෙනවානම් සියළු දෙනාම එකට එකතු වී එය කරමු යැයි ප්‍රකාශ කරන ලදි.ඔබතුමා යෝජනා කර , ඔබතුමා අදහස් කර , ඔබතුමා ප්‍රකාශ කරන බවත්, නමුත් එය ප්‍රකාශයට පමණක් සීමා වී ඇති බවත් , කිසිම සාධනීය ආකාරයට ඔබතුමා පිළිතුරක් ලබා නොදෙන බව ප්‍රකාශ කරන ලදි.නමුත් එය ප්‍රා.ස.වැනි පහල මට්ටමක සිට නොව ඉහල මට්ටමේ සිට ගත් විටත් කරන්නේ ඔවය ක්‍රම වේදයම බවත් පෙන්වා දෙන ලදි.අද මේ රට ගත්විට ඔබතුමාලාගේ පක්ෂයේ මන්ත්‍රීවරු පාර්ලිමේතුව නියෝජනය කරන බවත් , ෆයිල් එකක් ගෙනවිත් ඔවුන් පවසන්නේ සියළු දෙනාම හොරු බවයි.ආණ්ඩු කිහිපයකම ඔබතුමාලාගේ නායකයින් සිටි බවත් නමුත් කවදාවත් ඔය කියන හොරු අල්ලා ඔප්පු කර නොමැති බවත් පෙන්වා දෙන ලදි.ගිය වරත් ෆයිල් වගයක් පෙන්වා දැගලූ බවත් , නමුත් කිසිම හොරෙක් අල්ලා ඔප්පුකර පෙන්වා නොමැති බවත් ප්‍රකාශ කරන ලදි.ජනතාව කලඹලා ,රට කලඹලා , එදා තිබුනු ක්‍රියාමාර්ග වලට යමින් ආණ්ඩුව ගන්න යනවා නම් ප්‍රශ්නයක් නොමැති බවත් ,අරගලයට අපි කැමති බවත් , නමුත් එය කරන ක්‍රමයක් තිබෙන බවත් , රනිල් එලවන්නට හැකියාවක් නොමැති බවත් ,රනිල් ආවේ යන්නට නොවන බවත් ප්‍රකාශ කරන ලදි.මේ අය කියන ආකාරයට හැටනම ලක්ෂයක් ඡන්දය ලබා දුන් ගෝඨාභය මහත්තයා එලවා දැමූ බවත්, අගමැතිතුමා එලවා දැමූ බවත් , ඊටපසු මේ රට භාරගෙන කරන්නට පුළුවන් නායකයින් මේකේ ඇති බවත් ,එයාලට ආරාධනා කල නමුත් කිසිම කෙනෙක් රට භාර නොගත් බව පෙන්වා දෙන ලදි.සුජාත භාවයෙන් අරගලය කල බව ඇත්තක් බවත්,නමුත් ජනතා විමුක්ති පෙරමුණ , පෙරටුගාමී පක්ෂය අන්තර් විශ්ව විද්‍යාලීය ශිෂ්‍ය බල මණ්ඩලය දේශපාලනික වශයෙන් අත පෙවීම සිදු වී ඇති බව පෙන්වා දෙන ලදි.අවුරුදු 09 වෙනකම් උපාධිය ගන්න බැරුව සිටගෙන මේ රට තවත් අගාධයට දමමින් කටයුතු කරන බව පෙන්වා දෙන ලදි.අතිගරු ජනාධිපති තුමා විසින් රට ගොඩ නැගීම සඳහා දේශපාලන පක්ෂ පාට නොතකා සියල්ලන්ටම ආරාධනා කල බවත් , ඔබතුමාලාගේ පක්ෂය කිසිම සාකච්ඡාවකට සහභාගී නොවී සිට අද දිනයේ සාකච්ඡාවට පැමිණෙන බව ප්‍රකාශ කර සිටි බවත් පෙන්වා දෙන ලදි.දේශපාලඥයින් සියළුම දෙනා හොරු බවත් ,අපි විතරක් හොරකම් කරලා නෑ, අපට රට ගොඩනගන්නට පුළුවන් යැයි මතයක් රට තුල ,ජනතාව තුල ඔබතුමාලා ගොඩනගා ඇති බව ප්‍රකාශ කරන ලදි.මේ රට ගොඩ නගන්නට ඔබ තුමාලාගේ පක්ෂයට ශක්තියක් තිබේ නම් මේ මොහොතේ සහයෝගයෙන් කටයුතු කලයුතු නේදැයි විමසන ලදි.මේ පක්ෂය කරපු දේවල් මම කුඩා කාලයේ සිටම දන්නා බවත්, මම කුඩා කල සිටම පක්ෂය අධ්‍යනය කල බවත් ,මම මේ පක්ෂයත් සමග සම්බන්ධව සිටි බවත් ,මේ හැම දෙයක්ම දන්නා බවත් , මේ රටේ තිබුණු සම්පත් මොන තරම් ප්‍රමාණයක් විනාශකර ,ගිනිබත් කරාදැයි විමසන ලදි. එයම මේ දැනුත් කර අහිංසක ජනතාව පාරට දමා මේ කරන

සෙල්ලම කුමක්දැයි විමසන ලදි.මම නම් මගේ නායකයා කවුරු වුනත් නායකයා වැරදියි නම් වැරදියි කියා පවසන බවත් ප්‍රකාශ කරන ලදි.ඡන්දයක් තබා බලන ලෙසත් මහජනතාවගේ ප්‍රසාදයෙන් එන්නට බැරි වන බව පෙන්වා දෙන ලදි. එම නිසා ඉහල එවුන් මොන ඔලමොට්ටල වැඩ කරත් ඔබතුමාගෙන් එක ඉල්ලීමක් කරන බවද , ඔබතුමා මේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් වගකිවයුතු මන්ත්‍රීවරයෙක් බව ,මහජන නියෝජිතයෙක් බව මතක තබා ගෙන උහන ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් වැඩක් කරන්නට සභාවෙන් යම් තීන්දුවක් ගන්නවානම් , එය හොද දෙයක් නම් එයට සහයෝගය දෙන ලෙස ප්‍රකාශ කරන ලදි.නමුත් ඔබතුමා හැම දේටම විරුද්ධ වන බව පෙන්වා දෙන ලදි.පාර්ලිමේන්තුවේදීත් මේ සිද්ධියම වන බව පෙන්වා දෙන ලදි.පක්ෂ ඉතිහාසය ගැන අප දන්නා බවත් ,තාමත් ඒ දේම කරන බවත් ,රට එක පැය භාගයකින්ම ගිනි තැබූ බවත් පෙන්වා දෙන ලදි.සියළු පක්ෂ මේ වන විට සර්ව පාක්ෂික ආණ්ඩුවක් හැදීමට එකඟ වී ඇති බවත් ,නමුත් ජනතා විමුක්ති පෙරමුණට පමණක් මේ රටේ මිනිස්සු විදින දුක නොපෙනෙන බවත් පෙන්වා දෙන ලදි. රට දැන් යම් යථා තත්වයකට පත්වෙමින් තිබෙන බවත් , ගෑස් ටික මිනිසුන්ට දැන් ලැබෙන බවත් ,තෙල් පෝලිම් අඩු වී ඇති බවත් ප්‍රකාශ කරන ලදි.බඩු මිල අඩු වෙමින් යන බවත් , එයට ජනතා විමුක්ති පෙරමුනේ සහයෝගයත් අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදි. ජනාධිපතිතුමා හැම පක්ෂයකටම ආරාධනා කරන්නේ එම නිසා බව ප්‍රකාශ කරන ලදි.ඔබේ පක්ෂයේ ඉහල ඉන්න අය සහයෝගය ලබා නොදෙනවා සේම පහල ඉන්න විමලරත්න මන්ත්‍රීතුමා අපට සහයෝගය ලබා නොදෙන බවත් ප්‍රකාශ කරන ලදි.ඉතිං රටක් ඉදිරියට යයිදැයි ප්‍රකාශ කරන ලදි.එම නිසා සියළු දෙනාම එකට යනවා නම් එකට යමු යැයිද, ඔබතුමා යෝජනා කල පරිදි පක්ෂ පාට භේද නොතකා ඉදිරියේදී වැඩ කරමු යැයි ප්‍රකාශ කරන ලදි.ඔබතුමාට මම ගරු කරන බවත් ,ඔබතුමා දක්ෂයෙක් බවත් , මාගේ සහෝදරයකුත් ජනතා විමුක්ති පෙරමුනේ සිටින බවත් ප්‍රකාශ කරන ලදි.ඔය කියන ප්‍රතිපත්ති වලට මම විරුද්ධ බවත් ප්‍රකාශ කරන ලදි.නමුත් මම කිසිම කෙනෙක්ට ගරහන ,අපහාසයට ලක් කරන මිනිහෙක් නොවන බවත් , නමුත් අද මේ රටේ ජනතාව පීඩාවට පත්වෙන්නට මූලික හේතුව අවුරුදු 74 හොරා කාපු එකම නොවන බවත් ,එයට ජනතා විමුක්ති පෙරමුනත් වගකිව යුතු බව ප්‍රකාශ කරන ලදි.අරගලය කියන එක ගෙනල්ලා එකකින් අගමැති යැවූ බවත්, තව එකකින් ජනාධිපති යැවූ බවත් ,අනිත් එකෙන් බැසිල් යැවූ බවත් , දැන් රනිල් යවන්න හදන බවත් , රනිල් යවන්න හදන එකනම් එතරම් පහසු නොවන බවත් පෙන්වා දෙන ලදි.එම නිසා පක්ෂයක් ලෙස ඔබ පක්ෂ නායකයන්ට පවසා සිටිය යුත්තේ උහන සභාවේ මේ පිලිබදව කතා කල බවත්,ඔවුන්ගේ දරුවන් පිටරටවල්වල ගොස් හොදින් ඉගෙන ගන්නවා සේම මේ රටේ අහිංසක දුවා දරුවන්ට මේ රටේ නිදහසේ ඉගෙන ගැනීමට ඉඩ හසර ලබා දෙන ලෙසයි.එක එක විප්ලව අරගෙන ඇවිත් ඒ දරුවන්ගේ ඔළුව නරක් නොකරන ලෙස ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදි.අද රටේ පත්වී සිටින ජනාධිපති වරයාට හම්බකිරීමට අවශ්‍ය නැති බවත්,එතුමාට ගෙන යන්නට දෙයක් නොමැති බවත් ,එතුමාට දැන් ඉන්න තැනක් නැති බවත්,එතුමාට මේ නායකත්වය දෙන්න කෙනෙක් නොමැති බවත්,පොදුජන පෙරමුනේ ආශිර්වාදය ඇතිව,මේ වනවිට ජනතාවගේ ආශිර්වාදය ඇතිව , අද මේ රට ගොඩනගන්නට ඉදිරිපත් වී ඇති බවත් , අප ඒ ගැන ආඩම්බර වන බවත් ප්‍රකාශ කරන ලදි.ඒ ගැන ස්තුති වන්ත වන බවත් ප්‍රකාශ කරන ලදි.ඔය කිරුළ වෙන කෙනෙකුට හෝ එතුමාගේ දුවෙකුට පුතෙකුට දෙන්නට වත් නොව මේ රටේ දරුවන් වෙනුවෙන් ඉතාමත් වෙහෙස කාරීව මේ රට තිබුනු තැන දැනගෙන ඒ සියළු අභියෝගයන් භාර ගෙන , අද මේ රට යම් ස්ථාවරයකට ගෙන යන මොහොතක ඒ සදහා සහයෝගය ලබා දෙන ලෙස ඔබතුමාගේ පක්ෂයේ ඉහල නියෝජිතයන්ට පවසා සිටින ලෙසත් ප්‍රකාශ කරන ලදි.මේ ප්‍රාදේශීය සභාවේ ගන්නා තීන්දු තීරණ මේ වන විට ක්‍රියාත්මක නොවුනත් සාධනීය යෝජනා වලදී ඔබතුමාගේ කැමැත්ත ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.ඔබතුමා ගැන පෞද්ගලිකව කිසිම තරහක් නැති බවත් ,මා කතා කලේ අද රටේ දැවෙන ප්‍රශ්නය ගැන බවත් ප්‍රකාශ කරන ලදි.ජනතාව වෙනුවෙන් මින් ඉදිරියට වැඩක් කරන්නට පාර්ලිමේන්තුව නියෝජනය කරන නියෝජිතයන්ට හා පක්ෂයේ සියළුම දෙනාට ඥානය පහල වේවායි පතන බව ප්‍රකාශ කරන ලදි. එසේම රංජිත් මන්ත්‍රීතුමා , දෙලංකාවල මන්ත්‍රීතුමා ,උප සභාපතිතුමා දැක්වූ අදහස් අනුව එම යෝජනා ඇතුලත් කර මේ අයවැය සකස් කිරීම සිදු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉන්නා සිටින බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ.දෙලංකාවල මහතා.**

පසුගිය අවුරුදු වල අපි යම් යම් යෝජනා ඉදිරිපත් කල බවත් ,එම යෝජනා ඉදිරිපත් කිරීමේදී කිසිම යෝජනාවක් ක්‍රියාත්මක වුනේ නෑ කියන එකට මා විරුද්ධ බවත් ,එයට හේතුව විමලරත්න මන්ත්‍රීතුමාගේ වැලි පිලිබද යෝජනාවේ සභාපතිතුමා විශාල උනන්දුවක් දැක්වූ බවත් ,මමත් එය වරින් වර එතුමාගෙන් පෞද්ගලිකවත් අසා ඇති බවත් ,එයට මොකද කරන්නේ ,ඒ පිලිබද වර්තමාන තත්වය කෙසේදැයි එතුමාගෙන් මා නිතරම ඇසූ බවත් ප්‍රකාශ කරන ලදි.ඒ පිලිබදව මෙතුමා අරන් ගිය වැඩ පිලිවෙල ගැන ලොකු පැහැදීමක් නොතිබූ බවත් ,මොකද වෙළඳ පොලට එය දෙන්න පුළුවන්ද යැයි ගැටළුවක් තිබුන බවත් ප්‍රකාශ කරන ලදි.මේ ප්‍රදේශයේ වැලි විශාල වශයෙන් අලෙවි කරන නිසා,පැකට් කර වෙළඳ පොළට දැමීම සම්බන්ධව ගැටළුවක් තිබූ බව ප්‍රකාශ කරන ලදි.මෙතුමාගේ අදහස වූයේ අම්පාර දිස්ත්‍රික්කයේ වෙළඳ පොළවල් වලට ඉදිරිපත් කරනවාට වඩා හාඩ්වෙයාර් මට්ටමින් වෙනත් ප්‍රදේශ වලට ඉදිරිපත් කිරීම බව පෙන්වා දෙන ලදි.එතනදීසාධනීය තත්වයක් තිබූ බවත් නමුත් අවසානයේදී ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේදී වෙළඳ බලපත්‍රයක් ලබාගතයුතු බැවින් එතන හිරවී ඇති බවත් ප්‍රකාශ කරන ලදි.එම වෙළඳ බලපත්‍රය ලබා ගැනීමේදී රාජ්‍ය ආයතන ඇතුලේ ඇති නීත්‍යානුකූල තත්වයක් උඩ එය නැවතී තිබෙන බවත් ප්‍රකාශ කරන ලදි.සභාපතිතුමා නිවැරදි කරන්නට හදනවා නොවන බවත් ,මම දන්නා දෙයක් හංගාගෙන ඉන්නට මම කැමති නැති බවත් ,එම නිසා ඒ පිළිබදව පැහැදිලි කල බවත් ප්‍රකාශ කරන ලදි.මම මිල කමිටුවේ සිටින විට වැලි හා පස් ප්‍රවාහනයේදී කියුබ් එකකට යම් මුදලක් අයකල යුතුයැයි යෝජනා කල බවත් ,එය ක්‍රියාත්මක වූ බව පෙන්වා දෙන ලදි.ඒවායින් සභාවට ආදායමක් ලැබුනු බවත් ඒවාට ස්තූතිවන්ත වන බවත් ප්‍රකාශ කරන ලදි.නමුත් ගිය අවුරුද්දේ හා ඊට පෙර අවුරුද්දේත් පැහැදිලි ආදායමක් ගන්නට පුළුවන් යෝජනාවක් වන ඉන්ධන පිරවුම් හලක් ලබා ගැනීම සඳහා යෝජනාවක් මම ඉදිරිපත් කල බවත් ,මම අදටත් එම යෝජනාවේ සිටින බවත් ප්‍රකාශ කරන ලදි.නමුත් එය සදහා අඩුම තරමින් අමාත්‍යවරයාට ලිපියක් හෝ දැම්මාදැයි නොඅසන බවත් ,ඒ පිළිබඳ අසා වැඩක් නැති නිසා නොඅසන බවත් ප්‍රකාශ කරන ලදි.එමනිසා අපි කොපමණ හොද යෝජනා ඉදිරිපත් කලත් සමහර දේවල් හිතෙන්ම හිතා ක්‍රියාත්මක නොකරණ බව ප්‍රකාශ කරන ලදි.දැනට වුනත් ඒ සදහා පරක්කු නැතිබව පෙන්වා දෙන ලදි.මේ තිබෙන තත්වයත් සමග ලිපියක් සකස් කර ඉදිරිපත් කලහොත් පළමුවන වතාවෙන්ම ඉන්ධන පිරවුම් හලක් ලැබෙන බව ප්‍රකාශ කරන ලදි.එහෙම නොමැති වුවහොත් අපටත් පෞද්ගලිකව සහයෝගයක් ලබා දිය හැකිබව පෙන්වා දෙන ලදි. අදටත් මා එම යෝජනාව ඉදිරිපත් කරන බවත් ,එම යෝජනා දිහා ඔබතුමා හැරිලාවත් නොබැලූබව ඔබතුමා පිලිගත යුතු බව පෙන්වා දෙන ලදි.කෙසේ හෝ මේ සභාව ගොඩ දැමිය යුතු බවත් ,විමලරත්න මන්ත්‍රීතුමා පැවසූ පරිදි අනාගතයේ මේ සභාවේ සිටින්නේ කවුරුන්දැයි වැදගත් නොවන බවත් පවසා සිටින ලදි.රනිල් වික්‍රමසිංහ මහතා පවසා සිටියේ පැහැදිලිවම මේවා මට භුක්තිවිදින්නට නොලැබෙන බවයි.ඒ වගේ අපේ යුතුකමත් එය විය යුතු බව ප්‍රකාශ කරන ලදි.අසවල් සභාපතිතුමාගේ කාලයේ අසවල් මන්ත්‍රීතුමාගේ යෝජනාවක් අනුව සභාවට මේ ආකාරයට ආදායම් ලැබෙනවායැයි ඉදිරියේදී පවසන ආකාරයට වැඩ කලයුතු බවත් එවිට ඔබතුමාට ගෞරවයක් හිමිවන බවත් ප්‍රකාශ කරන ලදි.මේ යෝජනාව ගෙන එන තුන්වන අවුරුද්ද බවත් ප්‍රකාශ කරන ලදි.ලංකාව පුරා තිබෙන ප්‍රශ්නයක් වන නිවාස සැලසුමක් හදා ගන්නට ගියවිට මිනිසෙකුට විශාල වියදමක් දැරීමට සිදුවන බවත් විශාල ප්‍රශ්න රාශියකට මුහුණදීමට සිදුවන බවත් , නමුත් ඒ ප්‍රශ්න වලින් සියයට අනූවක් විසදන ආයතනයක් ලෙස ප්‍රාදේශිය සභාව හදුන්වන්නට පුළුවන් බවත් ,එම නිසා රු.50000.00 ක් පමණ ලබා දී නිවාස සැළසුමක් හදාගෙන ඇවිත් ප්‍රාදේශිය සභාව යටතේ අනුමත කර ගන්නට වෙහෙසිය යුතු බව පෙන්වා දෙන ලදි. උහන සභාවේ දැනට කාර්මික නිළධාරීන් තුන්දෙනෙක් සේවය කරන බවත් ,අපි සභාව ලෙස යම් මුදලක් වෙන් කර නිවාස සැළසුම් හදා සහන මිලකට මිනිසුන්ට ලබා දීමට වැඩපිලිවෙලක් 2023 වර්ෂයේදී සකස් කිරීමට යෝජනා කරන බවත් ප්‍රකාශ කරන ලදි.ඒ සදහා කාර්මික නිළධාරියාට ගමන් වියදම් දීමනාව ලබාදිය හැකි බවත් ,ඊට අමතරව වෙනත් වියදමක් දැරීම සිදුකිරීම නොකල යුතු බව ප්‍රකාශ කරන ලදි. එවිට එය ප්‍රාදේශිය සභාවට ආදායමක් ද වන අතර මිනිසුන්ට සහනයක්ද වන බව ප්‍රකාශ කරන ලදි.අපි අවම මුදල රු.10000.00ක් වශයෙන් ගත්විට මාසයකට නිවාස සැලසුම් 10 ක් කලහොත් රු.100000.ක් ආදායම ලැබෙන බව පෙන්වා දෙන ලදි.එසේ වුව හොත් අවුරුද්දකට රු.1200000.00 ලැබෙන බවත් ,එය පැහැදිලි ආදායම් මාර්ගයක් බවත් පෙන්වා දෙන

ලදි.නිවාස සැලසුම් සභාවෙන් ප්‍රශනයක් නොවී අනුමත කර ගැනීමට හැකියාව තිබෙන නිසා මිනිසුන් මේ සදහා අනිවාර්යයෙන්ම යොමුවන බව පෙන්වා දෙන ලදි.එසේම ස්ථාවර තැන්පතුවෙන් මුදල් ගැනීම සම්බන්ධව කතා කිරීමේදී මමත් සිටියානම් එයට විරුද්ධ වන බව විමලරත්න මන්ත්‍රීතුමා පැවසූ කාරණාවට මමත් අදහසක් ඉදිරිපත් කලයුතු බව ප්‍රකාශ කරන ලදි.ස්ථාවර තැන්පතුවෙන් මුදල් ගැනීමේදී සභාව විසින් කොන්දේසි දැමූ බව පැහැදිලි කරන ලදි.එයට හේතුව අප මේ කාලයේ දී කරනු ලබන යෝජනාවල සාර්ථකත්වය උඩ හෝ අසාර්ථකත්වය උඩ චෝදනා ලැබෙනවා හෝ පැසසුම් ලැබෙනවා වගේම ණය වී ගියෝ එහි චෝදනාවත් අපට ලැබෙන බව ප්‍රකාශ කරන ලදි.එම නිසා එදා අපි පවසා සිටියේ වෙනත් කිසිම කටයුත්තකට එම මුදල් ලබා නොගන්නා ලෙසයි.වවුචර් පත් සදහා ගෙවීමට ඇති මුදල් පමණක් ගෙවිය යුතු බව පැහැදිලිව ප්‍රකාශ කල බවත් ,තවද සභාවට ලැබෙන පලමු ආදායම් මුදලින්ම එය පියවිය යුතු බවයි.එසේම පුෂ්ප කුමාර මන්ත්‍රීතුමා රටේ දැනට පවතින තත්වය ගැන වැදගත් කතාවක් කල බවත් , හැමෝම පවසා සිටින්නේ අවු.74 ක් පාලකයින් හොරා කෑ බවයි .එම අවු.74 තුළ1994 පසු හැම ආණ්ඩුවකම ධනතා විමුක්ති පෙරමුණත් කොටස් කාරයෙක් බව පැහැදිලි කරන ලදි.නමුත් එයාලා අපි එකකට වත් නෑ කියන අදහස මිනිසුන්ට පෙන්නන්නට හදන බවත්,ආණ්ඩු එකින් එක විනාශ කරන්නට ඔවුන් හැමදාම ක්‍රියාකල බවත් පෙන්වා දෙන ලදි.1994 දී චන්ද්‍රිකා මැතිනියත් සමග එකතු වීආණ්ඩු හැදූ බවත් එම ආණ්ඩුවේ ඇමතිකම් ලබාගත් බවත් ,තමන්ගේ නොහැකියාව රටට පෙනෙන විට ඉල්ලා අස්වී මෙයට විරුද්ධව කටයුතු කල බවත් ප්‍රකාශ කරන ලදි.පසුගිය යහපාලන ආණ්ඩුවේ 10 දෙනෙකුගේ කමිටුවක් තිබූ බවත් ,අනුර කුමාර එහි සාමාජිකයෙක් බවත් පෙන්වා දෙන ලදි.මෙතන මිනිසුන්ට වැරදී ඇති බවත් ,අනුර කුමාරගේ සුරංගනා කතා වලට රැවටී ඇති බවත් පෙන්වා දෙන ලදි.අවු. 74 තුළයම් යම් මිනිසුන් ගසා කන්නට ඇති බවත්,නමුත් රට සංවර්ධනය කරන්න,රටට විශාල ප්‍රශ්නයක් වූය යුද්ධය නැති කරන්නට ඔවුන් කටයුතු කල බව අමතක නොකල යුතු බවත් පෙන්වා දෙන ලදි.නමුත් ඒ කිසිම දෙයක් මේ ජනතා විමුක්ති පෙරමුණට නොපෙණුන බව ප්‍රකාශ කරන ලදි.මේ රට මේ තත්වයෙන් ගොඩ ගන්නට අත්දැකීම් බහුල සිටිය යුතු බව අප කවුරුත් පිලිගත් කාරණාවක් බවත්,මේ මොහොතේ දැවෙන ප්‍රශ්නයට පිලියමක් ලෙස රනිල් වික්‍රමසිංහ සුදුසු පුද්ගලයෙක් බව පිලිගන්නා බව ප්‍රකාශ කරන ලදි.බුද්ධිමත් කියන විශ්ව විද්‍යාල සිසුන් අන්තිමට වැද්දෙක්ගේ පදේට නැටූ බවත් ,අපේ රටේ දෙමාපියන්ට මේක නොතේරෙන බවත් , දරුවෝ උසස් පෙළ සඳහා අමතර පන්ති යන බවත් එම පන්ති වල ජනතා විමුක්ති පෙරමුනේ අදහස් උගත්වන බවත් , පන්ති සියයක් ගත් විට පන්ති 80 පමණ ජනතා විමුක්ති පෙරමුනේ දේශන තියන බවත්, ඒ දේශනයේ ජනතා විමුක්ති පෙරමුණ කියා නොකියන බවත් ,වක්‍රාකාරයෙන් පාලකයන් හා පාලන තන්ත්‍රය ගැන විරුද්ධව නැගී සිටිය යුතු බව හඩක් නගන්නට සිසුන් පොළඹවන බව ප්‍රකාශ කරන ලදි.ඒ ළමයි ඉතිං විශ්ව විද්‍යාලයට ගියාට පසු අරගල කරන බව පෙන්වා දෙන ලදි.මම කතා කරන්නට ගිය කොටසකුත් කතා කරන්නට වූ බවත් ,ජනතා විමුක්ති පෙරමුණ ගැන අපි අපි කතා කලාට වැඩක් නැති බවත් මෙතන සිටින සියළු දෙනාම ඒ ගැන දන්නා බව ප්‍රකාශ කරන ලදි.හිටපු සභාපති තුමා ආගම පිළිබද ප්‍රශ්නයක් කිවූ බවත්,එය දැනට රටේ තිබෙන විෂබීජයක් බවත් පෙන්වා දෙන ලදි.නිර්ආගමික රටක් සැදීමට මේ පක්ෂවල උත්සාහය බව පෙන්වා දෙන ලදි.මේ රට කොයි පැත්තකට යනවාදැයි තීරණය කලයුත්තේ රටේ ජනතාව බවත්,ඒවා තේරුම් ගත යුතු බවත් ,පෙර පාසලේ සිට මේ රටට ආදරය කරන , ඇලුම් කරන ජනතාවක් බිහි කල යුතු බවත් , සොරකම ,වංචාව, කරන්නට හොද නෑ කියන මතය හිතට තදින් කා වැද්දිය යුතු බවත්,එවිට අවුරුදූ 20 දී හොද පුරවැසියන් බිහිවී හොද රටක් හදන්නට පුළුවන් බවත් ප්‍රකාශ කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් ප.ව. 12.05 තේ විවේකය සඳහා සභාව කල් තබන ලදි.

ඔරලෝසු වේලාවෙන් ප.ව. 12.25 තේ විවේකයෙන් පසුව නැවත සභාව ආරම්භ කරන ලදි.

**ගරු සභාපතිතුමා.**

මාණ්ඩලික පත්‍රය ගැන සාකච්ඡාවේ දී ස්ථාවර තැන්පතුවෙන් මුදල් ගැනීම සම්බන්ධව කතා කල බවත් , විමලරත්න මන්ත්‍රීතුමා පවසා සිටියේ ස්ථාවර තැන්පතුවෙන් මුදල් ගැනීම ගැන එතුමන් විරුද්ධ වන බවයි.ස්ථාවර තැන්පතුවෙන් මුදල් ලබා ගෙන තිබෙනවාදැයි ඔබතුමාලා සොයා බලන ලෙස ප්‍රකාශ කරන

ලදි.මමස්ථාවර තැන්පතුවෙන් මුදල් ලබා ගැනීමේ යෝජනාවට අනුමැතිය ලබා ගත්තේ හදිසියේවත් සභාව විසුරුවා හැරිය හොත් තිබෙන ණය පියවීම සිදුකිරීම සඳහා බවත්, තවම ස්ථාවර තැන්පතුවෙන් මුදල් ලබා ගෙන නොමැති බව ප්‍රකාශ කරන ලදි.යෝජනා ක්‍රියාත්මක කලේ නෑ කියා විමලරත්න මන්ත්‍රීතුමා චෝදනා කරන බවත් ,ඔබතුමා මාසයකට එක් දිනක් සභාවට පැමිණිලා චෝදනා කරන්නේ නැතිව සොයා බලා කතාකරන ලෙස ප්‍රකාශ කරන ලදි.සභාව පිටුපසට ගොස් බලන ලෙසත් , කම්පැක්ටර්ය සර්විස් කිරීමට ගියවර රු.100000.00 මුදලක් වැයවූ බවත් ,දැන් සභාවේම එම කටයුතු සිදුකරගන්නා බවත් ප්‍රකාශ කරන ලදි. සභාවේ ඇති කැබ්රථයනුත් සර්විස් කරන්නේ සභාවේම බවත් , ඔබතුමා සභාවේ වෙන්නේ මොනවාදැයි සොයා බලා කතා තරනවානම් ඉතා සුදුසු බව ප්‍රකාශ කරන ලදි.වැලි යෝජනාව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් නතර වී ඇති බවත් පෙන්වා දෙන ලදි.තනතුර සඳහා ව්‍යාපාර ලියාපදිංචි එකක් දෙන්නට බැරි ප්‍රශ්නයක් තිබෙන බවපෙන්වා දෙන ලදි.ඔබතුමාලා විවිධ කතා හදා චෝදනා කරන්නට ප්‍රථමව සොයා බලා කතා කරනවානම් හොද බව පෙන්වා දෙන ලදි.විමලරත්න මන්ත්‍රීතුමා දෙමටමල්පැලැස්ස ප්‍රදේශයේ 22/146 ගෙදර සිටිය එක ගැන මම ආඩම්බර වන බවත් 22/114 නිවසේ වසන්ත පියතිස්ස මහතා, ඔබතුමාගේ පක්ෂයේ මන්ත්‍රීවරයාගේ නිවසට යන පාර හැදුවේ මම බවත් ප්‍රකාශ කරන ලදි.පාර්ලිමේන්තු මන්ත්‍රීට බැරිවුන දේ මම ප්‍රාදේශිය සභා සභාපතිවරයා ලෙස සිට එය කත බවත් , එම නිසා මම අසාර්ථක නැති බවත් ප්‍රකාශ කරන ලදි. හැබැයි මේ සභාවට ආදායම් ගෙන එන්නට ක්‍රම වේදයක් නොමැතිනම් , ගන්න ගන්න තීන්දු හිරවෙනවා නම් , එය ප්‍රශ්නයක් බව පෙන්වා දෙන ලදි. සභාපතිවරයා විදියට අසාර්ථකයි කියා පවසනවානම් මගේ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා ලෙස මම ඉතා සාර්ථක බව පෙන්වා දෙන ලදි. පසුගිය අවු.04 තුල රු.50000.00 ගනනේ ලබාදුන් බවත්, එම මුදලින් ඔබතුමා කොට්ඨාශයට කල සේවය කියන ලෙස ප්‍රකාශ කරන ලදි.ඔබතුමා පවසන්නේ යහපත් පුද්ගලයින් හැදිය යුතු හා යහපත් සමාජයක් බිහිකල යුතු බවයි. නමුත් ඔබ තුමාට ලබාදුන් මුදලින් පුස්තකාලයට පොත් ගෙනත් දමන විට ඔබතුමා ඒ ගෙනත් තිබෙන්නේ කුමන පොත්දැයි විමසන ලදි . ඔබතුමා ගෙනත් තිබෙන සියළුම පොත් ජනතා විමුක්ති පෙරමුණට අදාල පොත් බව ප්‍රකාශ කරන ලදි.රංජිත් මන්ත්‍රීතුමා එතුමාට ලැබෙන රු.50000.00 මුදලින් උහන කොට්ඨාශයට වැඩක් කරන බවත් , ඔබතුමා උහන කොට්ඨාශයට කරපු දෙයක් නැති බව ප්‍රකාශ කරන ලදි. ඔබතුමා එක වාරයක් ඉන්ධන පිළිබද ගනන්හදා රැගෙන පැමිණි බවත්, ඔබතුමා ගේ ලයිට් 20 දැමීම සඳහා , එක ලයිට් එකක් තුනේ කොළණියේත්, තව එකක් මාකණ්ඩියේත් , ඔය ආකාරයට විවිධ පැතිවල ලයිට් දැමීම සිදුකරන බවත් ,ඒවා දමන්නට වාහනය විවිධ ප්‍රදේශ වලට යායුතු බැවින් , වියදම වැඩි බවත් පෙන්වා දෙන ලදි. සභාවේ දුරකතනයෙන් මම කතා නොකරන බවත් , මාගේ ජංගම දුරකතනයෙන් හැමදේටම කතා කරන බවත්,මේ දිනවල ආදායම් එකතුකර ගැනීමට වෙහෙසෙන බවත් පෙන්වා දෙන ලදි.මන්ත්‍රීවරුන්ට රු.75000.00 මුදල ලබා දීම සඳහා ආදායම් එකතුකර ගනිමින් සිටින බව ප්‍රකාශ කරන ලදි.ඔබතුමා කතා කරන්නට පෙර සාක්ෂි ඇතිව කතා කරන ලෙසද ප්‍රකාශ කරන ලදි.අපි තරම් වැඩ කරපු ආණ්ඩුවක් නැති බවත්, අපි තරම් වැඩ කරපු සභාවක් නැති බවත් ප්‍රකාශ කරන ලදි.අපි අපේ වියදම් අඩු කර ඇති බවත් ,මාගේ වාහනයේ ඉන්ධන වියදම අඩු කර ඇති බවත් ,ඒවා බැලිය හැකි බවත් පෙන්වා දෙන ලදි. ඊලග අයවැය වේලාවට කියන්නට නොසිට ඔබගේ හොද යෝජනා ලබා දී සාකච්ඡා කර හොද අයවැයක් ඉදිරිපත් කිරීමට ඔබ සියළුදෙනාගේ සහයෝගය ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදි. සියළුදෙනාම සර්විස් සෙන්ටර් එකක් දමන ලෙස ඉල්ලා සිටි බවත් , නමුත් එය ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන නොමැති නිසා බහු කාර්ය සහයකයෙකු සතු භාණ්ඩ ටික යොදා ඔහු විසින් සභාව සතු වාහන සර්විස් කරන බවත් , එමගින් වියදම අඩුකර ඇති බවත් පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී දර්ශන නුවන් විශ්ණුදේව මහතා.**

ආදායම් වියදම් ගැන මගේ රැකියාවත් සමග බැදෙන වචනයක් බවත් නිසා ඒ ගැන කතා කරන්න සිතුව බවත් ,රජගල කන්ද ලැන කතා කිරීමේදී ආදායම උපයන්න හොදම ස්ථානයක් බව පෙනී යන බවත් ,අප සමාගමේ විධායක අධ්‍යක්ෂ වරු රජගල නැරඹීම සඳහා රැගෙන ගොස් ඇති බව ප්‍රකාශ කරන ලදි.රජගල යනු මා විසින් අධ්‍යයනය කරපු ආකාරයට 10% ක් පමණ පුරාවස්තු හොයාගෙන ඇති භූමියක් බවත් ,තව 90 %ක් කැනීම් කිරීමට ඇති බවත් පෙන්වා දෙන ලදි.අනුරාධපුර ,පොලොන්නරු ,ආදී යුග කිහිපයක් එහි

තිබෙන බවත් ,එම නිසා එතනින් ලොකු ආදායමක් ඉපයිය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.ආදායම් උපයන ආකාරය කෙටියෙන් පැහැදිලි කලොත් සාමාන්‍යයෙන් හැම දිනකම තිහක් හතලිහක් ජනතාව මෙය නැරඹීමට සිටින බවත්,අපිඑය 20 ලෙස නිගමනය කල හොත් රු.200.00 ටිකට් එකක් ගසා එය ලබා දුන්නොත් දින 30 ක් ගිය විට මාසයට රු. 120000.00 ක ආදායමක් ලැබෙන බවත් ,මංගලගම පැත්තෙන් වාහනයක් රජගල කන්දේ උඩටම යා හැකි බවත් එය නැරඹීමට එන මුදල් තිබෙන අය පයින් යාමට අකමැති බවත් ගමන දුෂ්කර නිසා පයින් යන්න අකමැති බවත් වාහනයෙන්ම යන්නට ඔවුන් කැමති බවත් එවැනි ව්‍යාපාරිකයන්ගෙන් රු. 2000.00 ක් වැනි ටිකට් එකක් කැඩිය හැකි බවත් පෙන්වා දෙන ලදී. රු. 2000.00 බැගින් වාහන 60 ක් අවොත් යැයි නිගමනය කළහොත් එක්ලක්ෂ විසි දහසක ආදායමක් ලැබෙන බවත් පෙන්වා දෙන ලදී. පෞද්ගලික අය වෙනම කැබ් එකක යන්න රු. 12000.00 ක් අය කරන බව පෙන්වා දෙන ලදී. අපට කැබ් දාන්න බැරිනම් එතන වාහන වලින් රු. 2000.00 ක් වැනි මුදලක් අය කර ගත හැකි බව පෙන්වා දෙන ලදී. සමස්ථ ආකාරයට බැලූ විට මාසයකට ලක්ෂ තුනක ආදායමක් ලැබිය හැකි බව පෙන්වා දෙන ලදී . රජගල යනු විශාල සම්පතක් බවප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩබ්. රාණි මැණිකේ මිය**

දර්ශන නුවන් මන්ත්‍රීතුමා ඇත්තටම හොඳ යෝජනාවක් ගෙනා බවත් එසේම මීට අවු.2 කට උඩදී වගේ දෙලංකාවල මන්ත්‍රීතුමා ඉන්ධන පිරවුම්හල සම්බන්ධව හොඳ යෝජනාවක් ගෙනා බව ප්‍රකාශ කරන ලදී. දැන් මේ මොහොත වන විට ඒ යෝජනාවල් දෙක අහගෙන සිටීමේදී ඒ ගැන විශාල වශයෙන් සිතා බැලූ බවත් ඉන්ධන පිරවුම්හල ගැන කතා කිරීමේදී සභාපතිතුමාව අගයන්නට උවමනා බවත් පසුගිය කාලයේ ඉන්ධන ප්‍රශ්නයට විසඳුම් ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී. අනෙක් සභාවල් සමඟ සැසඳීමේදී සභාපතිවරයෙක් ලෙස මෙතුමා ඉතාමත්ම හොඳ සභාපතිවරයෙක් බව ප්‍රකාශ කරන ලදී. ඉහත යෝජනා ක්‍රියාත්මක කිරීමට හැකිනම් අපට හොඳ ආදායම් මාර්ග වන බව ප්‍රකාශ කරන ලදී. මෙතුවක් කල් රජගල තුළින් ආදායම් මාර්ගයක් උත්පාදනය කිරීමට අදහසක් පහළ නොවීම ගැන කණගාටු වන බවත් ප්‍රකාශ කරන ලදී. එක් වර්ෂයකදී දයාතිලක මන්ත්‍රීතුමා විසින් යෝජනාවක් ගෙනා නමුත් අප ඒ සම්බන්ධව කටයුතු නොකළ බවත් නමුත් ඉදිරියේදී මේ මොහොතේ සිටම ආදායමක් සනාථ කළ බවත් ප්‍රකාශ කරන ලදී. තෙල් සම්බන්ධව කතා කළ නිසා විශේෂයෙන්ම අපේ සභාපතිතුමාට ස්තූතියක් කරන බවත් ප්‍රකාශ කරන ලදී. අපට අවස්ථාවන් 04 කදී තෙල් ලීටරය ගණනේ ලබා දුන් බවත් මම අනෙක් සභාවලට කතා කිරීමේදී දැන ගන්නට ලැබුනේ එම සභාවල සභාපතිවරයෙක් මන්ත්‍රීවරුන්ට එම ප්‍රතිපාදනය ලබා නොදුන් බවයි. ආඩම්බරයි ඔබතුමා ගැන සභාපතිතුමනි. එසේම ඔබතුමාට බෙහෙවින්ම ස්තූතිවන්ත වන බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී කේ.බී. විමලරත්න මහතා**

මේ අවස්ථාව ලබා දීමට මැදිහත් වීම ගැන විශේෂයෙන්ම ගරු උප සභාපතිතුමාට ස්තූතිවන්ත වන බවත් මම ලොකු කාලයක් අරගෙන උත්තර දීමට හදන්නේ නැති බවත් එසේ උත්තර දීමෙන් වැඩක් නොවන බවත් ප්‍රකාශ කරන ලදී. මාණ්ඩලික වාර්තාව ඉදිරිපත් කළාට පසු මම කතා කළේ මාණ්ඩලික වාර්තාව ගැන පමණක් බවත් ඒ තුළින් ඔබතුමාට චෝදනා නොකළ බවත් නමුත් ඔබතුමා මට ලොකු චෝදනා ටිකක් එල්ල කළ බවත් පෙන්වා දෙන ලදී. මම කියා සිටියේ මා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සම්බන්ධව බවත් දර්ශන මන්ත්‍රීතුමා දැන් ඉදිරිපත් කළ රජගල කන්ද ගැන යෝජනාව මීට අවුරුදු 02 කට පමණ පෙර දයාතිලක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ බවත් පරණ වාර්තා පොත් බැලුවොත් එයට මම ලොකු පැහැදිළි කිරීමක් කළ බවත් මම මගේ කැමැත්ත ප්‍රකාශ කළ බවත් පහැදිලි කරන ලදී. ඔය යෝජනාව දයාතිලක මන්ත්‍රීතුමා විධිමත්ව ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කරන ලදී. මේ යෝජනා මේ සභාවට නොදැම්මා නොවන බවත් එමනිසා සභාපතිතුමා එකවරම චෝදනා කරනවා මම එතුමාට චෝදනා කරනවා කියාප්‍රකාශ කරන ලදී. ආදායම් වැඩි කර ගැනීමේ යෝජනා ක්‍රියාත්මක කරන්නට අපේ මැදිහත්වීමක් උත්සාහයක් නොතිබුනු බව ලෙස දැන් හැඟෙන බවත් ප්‍රකාශ කරන ලදී. දැන් රජගල කන්ද ගැන දර්ශන මන්ත්‍රීතුමා පැහැදිළි කරපු දේ සමඟ අපට ලොකු ජවයක් එන බවත් ප්‍රකාශ කරන ලදී. නමුත් මෙය මීට අවුරුදු 02 කට පමණ පෙර කරන්නට තිබුණු දෙයක් බව ප්‍රකාශ කරන ලදී. එපමණක් නොව

හිමිදුරාව වැව සම්බන්ධ කතා කළ බවත් ලලිත් මන්ත්‍රීතුමා දඩයම්තලාව වැව සම්බන්ධව කතා කළ බවත් ප්‍රකාශ කරන ලදී. මේ සභාවේ ගෙනෙන සියලු දේට මම විරුද්ධ වන බව පුෂ්ප කුමාර මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටි බවත් ඔබතුමාලා මේ සභාවේ ගෙනෙන එකම එක යෝජනාවකට හෝ මම විරුද්ධ වූවා නම් ඔප්පු කර පෙන්නන ලෙසද ප්‍රකාශ කර සිටින ලදී. ඉන්ධන පිරවුම්හල සම්බන්දව, වැලි සම්බන්ධව කතා කිරීමේදී එසේ කවදාවත් විරුද්ධ නොවුනු බව පෙන්වා දෙන ලදී. නමුත් මම අයවැය වාර්තාවට විරුද්ධ වූ බව ප්‍රකාශ කරන ලදී. ඔබතුමා පවසා සිටියේ අලුත් මන්ත්‍රීවරුන්ට ලබා දෙන රු. 50000.00 මටද ලබා දුන් බවයි. නමුත් මම එම මුදල් ගෙදර අරගෙන ගියේ නැති බවත් පෙන්වා දෙන ලදී. එම රු. 5000.00 කරන්නට යෝජනා ටිකක් දුන් බව පෙන්වා දෙන ලදී. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වීථි ලාම්පු සවි කරන්නට මම යන්න උවමනා නැති බවත් එයට අදාල යෝජනාව දුන් පසු එය සභාව මඟින් ක්‍රියාත්මක කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී. ඊට පෙර සාහිත්‍ය උත්සවයකට යම් මුදල් ප්‍රමාණයක් වෙන් කරන්නට යෝජනාව ලබා දුන් බවත් එය ක්‍රියාත්මක කිරීම මාගේ කාර්ය භාර්යක් නොවන බවත් එය මේ සභාවේ ලේකම්තුමිය ඇතුලු නිලධාරි මණ්ඩලයේ වගකීමක් බවත් පෙන්වා දෙන ලදී. එය සැලසුම් කළ යුත්තේ සභාව මඟින් බව පෙන්වා දෙන ලදී. පුස්තකාලයට පොත් ලබා දුන් බවත් එයින් එක පොතක් ජනතා විමුක්ති පෙරමුණ යැයි නම් ලියා ඇති එක පොතක් මට පෙන්වන්න යැයි ප්‍රකාශ කරන ලදී. නමුත් සභාපතිතුමා පවසා සිටියේ ජනතා විමුක්ති පෙරමුණේ පොත් පුස්තකාලයට ලබා දී ඇති බවයි. පරිවර්ථන පොත් විශාල වශයෙන් ලබා දුන් බවත් රුසියන් සාහිත්‍ය ශ්‍රී ලංකා සාහිත්‍ය ජර්මන් සාහිත්‍ය ආදී පොත් මා විසින් ලබා දී ඇති බවත් පැහැදිළි කරන ලදී. නමුත්හැමදාම බලන පොතකට වඩා මේක වෙනස් පොතක් බවත් පෙන්වා දෙන ලදී. ගුරු ගීතය ඇති බවත් ඒවා කියවා බලන ලෙසත් ප්‍රකාශ කරන ලදී. ගුරු ගීතයෙන් කියන්නේ ස්වෙච්ඡාවෙන් පාසලක උගන්නන්නට ගොස් පාසලෙන් නික්මෙන ආකාරය හා පාසලේ අනාථ දැරියක් මහාචාර්යවරියක් දක්වා රැගෙන ගිය කතාවක් බවයි. ඔය කවුරු කවුරුත් කතන්දර කීවාට මම ඒවා ගණන් නොගන්නා බවත් පුෂ්ප කුමාර මන්ත්‍රීතුමාගේ ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ සහෝදරයෙක් ගැන එතුමා පවසා සිටිය නිසා මා මෙසේ එතුමාට පවසා සිටිය බවත් බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ හා ලංකාවේම ප්‍රසිද්ධ සමන්ත වදාආරත්න ඉතාමත්ම හොඳ මනුස්සයෙකු බව ප්‍රකාශ කරන ලදී. එසේම දෙලංකාවල මන්ත්‍රීතුමාගේ මස්සිනා වන ඉතිහාසය සම්බන්ධ විශ්ව විද්‍යාල උපාධියක් තිබෙන මහා දැවැන්ත පුරුෂයෙක් මද්දුමබණ්ඩාර මහතා ගලහිටියාගොඩ විද්‍යාලයේ ගුරුවරෙක් බවත් මම ඉතාමත්ම ගරු කරන පුද්ගලයෙක් බවත් ප්‍රකාශ කරන ලදී. මමත් ඉතිහාසය සම්බන්ධව මොනවා හරි දැනගන්නට උවමනා වුවහොත් ඔහුගෙන් අසා දැනගන්නා බවත් ප්‍රකාශ කරන ලදී. මම කවදාවත් කාටවත් චෝදනා කර නැති බවත් ප්‍රකාශ කරන ලදී. ඔබතුමාලා පවසා සිටින ආකාරයට ජනතාවට තෙල් ටික ගෑස් ටික පොහොර ටික ගෙනත් දී බඩු මිළ අඩු කිරීම සිදුවුවහොත් ජනතා විමුක්ති පෙරමුණේ හීතිකාව නැතිවේවි යැයි ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මහතා**

අපේ මතය දරන්නේ නැති සහෝදර සහෝදරියන් සිටිය හැකි බවත් එයාලාගේ මතය අපි පිළිගන්නේ නැති බවත් නමුත් අපි අපේ ඥාතිකම් පවත්වාගෙන යන බවත් සුහදකම් පවත්වන බවත් මේ සභාවේ ඒවා ඇදගෙන කුණු බක්කි අවුස්න කපුටෝ වගේ කෙටවන්න හදන්න එපා යැයි ප්‍රකාශ කරන ලදී. ජනතා විමුක්ති පෙරමුණ හැමදාම කරන්නේ එය බවත් රට කොටවන්න බැරිනම් පවුලක් හෝ කොටවන බවත් ප්‍රකාශ කරන ලදී. එනවානම් විවාදයකට එසේ එන්න යැයි ප්‍රකාශ කරන ලදී. මේ සභාවෙන් හෝ වෙනයම් අවස්ථාවක හෝ නීති විරෝධීව හෝ පගා ගසා ජාවාරම් කර හොරකම් කර මොනවා හෝ දෙයක් හොරා කාලා තිබේනම් හෝ මේ දෙලංකාවලට විරුද්ධව එක වචනයක් පවසන්න යැයි ප්‍රකාශ කරන ලදී. එසේ කියන්නට හැකි වුවහොත් මාගේ තිබෙන වත්කම් පවා ලියා දෙන බවත් ප්‍රකාශ කරන ලදී. එමනිසා නිර්භයව කොන්ද කෙලින් තබාගෙන කතා කරන්නේ කිසිම දේකට සම්බන්ධ නැති හින්දා බවත් ප්‍රකාශ කරන ලදී. සමිති සමාගම් මංකොල්ල කාපු අය ලක්ෂ හත අට පොලු තියපු අය උහන නගරයට ඇවිත් පුරාජේරු දොඩවන බවත් ප්‍රකාශ කරන ලදී. ඒවගේ උන් තමයි ඔය ජනතා විමුක්ති පෙරමුණේ සිටින්නේ. උන් කියනවා උන් රට හදනවා කියා යැයි ප්‍රකාශ කරන ලදී. තර්කයක් ගෙන එන්න බැරිවුනාම මිනිසුන්ගේ පවුල් වල දේවල් සභාවට ගෙන එන්න එපා යැයි ප්‍රකාශ කරන ලදී.

ඔරලෝසු වේලාවෙන් ප.ව. 1.10 ට ගරු ප්‍රා.ස. මන්ත්‍රී කේ.බී. විමලරත්න මහතා පිටවී යන ලදී.

**2023 අයවැය සැකසීම සම්බන්ධ මාණ්ඩලික පත්‍රය හා අයවැය කාල සටහන සඳහා එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 05/2022/08 (02)**

සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් නීතිඥ ආර්.ජී. කුලරත්න මහතා උහන ප්‍රාදේශීය සභාවට අයත් කඩ කාමර බදු ගිවිසුම පරීක්ෂා කර බලා නිර්දේශ කර සභාව වෙත යොමු කර ඇති අතර එම බදු ගිවිසුම සභා අනුමැතියට යෝජනා කර ඉදිරිපත් කරමි

<u>බදු ගිවිසුම</u>

අංකය :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් පනවන ලද 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත අනුව අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇතිව ස්ථාපනය කරන ලද සංස්ථාවක් වන ........................................ දරණ ස්ථානයේ තම ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන උහන ප්‍රාදේශීය සභාව සහ/ හෝ එකී ප්‍රාදේශීය සභාව වෙනුවට ව්‍යවස්ථාපිතව සංස්ථාපනය කරනු ලබන වෙනත් අනුප්‍රාප්තික ආයතනයක්ද ඇතුළුව මින් ඉදිරියට පළමු පාර්ශවය ලෙස හඳුන්වන මෙහි බදු දීමනාකාර පාර්ශවය එක් පාර්ශවයකටද ........................................ යන ස්ථානයේ පදිංචි අංක ........................................ දරණ ජාතික හැඳුනුම්පත් හිමි ........................................ යන අය සහ සිය උරුමක්කාර, පොල්මකාර සහ අද්මිනිස්ත්‍රාසිකාර බලකරුවන් ඇතුලත් වන පරිදි මින් ඉදිරියට දෙවන පාර්ශවය ලෙස හඳුන්වන බදු ගැනුම්කාර පාර්ශවය අනෙත් පාර්ශවයද ඇතුලත් වන සේ මෙහි පහත උප ලේඛනයේ විස්තර කරනු ලබන දේපල සම්බන්ධයෙන් වර්ෂ .................... ක් වූ .................... මස .................... දින ........................................ දී මෙහි පහත සඳහන් කරන ලද සියළුම අංක 1 - 35 දක්වා පොරොන්දු වගන්ති වලට යටත්ව ඉහත කී පළමු පාර්ශවය වෙනුවෙන් .................... ප්‍රාදේශීය සභාව වෙනුවෙන් සභාපතිවරයා වන සහ ලේකම්වරයා වන ........................................ යන අයද දෙවන පාර්ශවය වෙනුවෙන් ඉහත කී .................................... මෙහි පහත අත්සන් කර ඇති ගන්නා ලද බදු ගිවිසුමයි.

ඉහත කී පොරොන්දු ගිවිසුම කෙසේද යත්

01. මෙම බදු ගිවිසුම වර්ෂ .................... වූ .................... මස .................... දිනෙන් ආරම්භ වී වර්ෂ ..............වූ .................. මස ............... දිනෙන් අවසන් වන බවට දෙපාර්ශවය පිළිගනී.

(ගිවිසුම බල පැවැත්වෙන කාලය අවුරුදු 03 කි)

02. දෙපාර්ශවයන් එකඟ වූ පරිදි මාසික බදු කුලිය ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් ........................................ (රු.......................) ක් වේ.

03. බදු දේපලේ භුක්තිය භාර ගන්නා දින හෝ ඊට ප්‍රථම මාස 06 ක බදු කුලියට සමාන ආපසු ගෙවන තැන්පත් මුදලක් වශයෙන් සහ මුල් මාසයේ බදු කුලිය දෙවන පාර්ශවය විසින් එකවර ගෙවා නියමිත රිසිට් පතක් ලබා ගත යුතුය.

04. මාසික බදු කුලිය සෑම මසකම 10 දින හෝ ඊට පෙර දේපල පිහිටි ප්‍රදේශය අනුව නියමිත උප කාර්යාලයට දෙවන පාර්ශවය විසින් ගෙවා නියමිත රිසිට් පත ලබා ගත යුතුය.

05. නියමිත දිනට නොගෙවා මාසික බදු කුලී ගෙවීම ප්‍රමාද වන ප්‍රථම මාසය සඳහා ................ (.......%) දෙවන මාසය සඳහා ........... (............%) වශයෙන් දඩ මුදලක් සමඟ ඒ ඒ මාසයේ බදු කුලිය දෙවන පාර්ශවය විසින් ගෙවිය යුතු අතර, මාසික බදු මුදල ගෙවීම ප්‍රමාදවන තෙවන මාසයෙන් පසු මෙම ගිවිසුම අහෝසිවන බව දෙවන පාර්ශවය පිළිගනී.

06. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව නැගෙනහිර පළාත් සභාව සහ මෙහි පළමු පාර්ශවය විසින් දැනට පනවා ඇති බදු කාලය තුල පනවනු ලබන අණ පනත් රෙගුලාසි අතුරු ව්‍යවස්ථා වලට සහ ඒවාට අනුව නිකුත් කරනු ලබන නියෝගයන්ට යටත්ව වාර්ෂිකව වෙළඳ බලපත්‍රයෙන් අවසර ලබා ගත් වෙළඳ ව්‍යාපාරය පවත්වාගෙන යන බවට දෙවන පාර්ශවය එකඟ වේ.

07. වාර්ෂික වෙළඳ බලපත්‍රයෙන් අවසර දීම ඇති ව්‍යාපාර කටයුතු වෙනස් කිරීම සඳහා වන පළමු පාර්ශවයේ ඉල්ලීමක් සඳහා ඉඩම දී හෝ නොදීම පිළිබඳ අයිතිය පළමු පාර්ශවය රඳවා තබා ගෙන ඇති බව දෙවන පාර්ශවය පිළිගනී.

08. එක් මසකට ප්‍රථම පළමු පාර්ශවය වෙත ලිඛිතව දැනුම් දීමෙන් ගිවිසුම අවසන් කර දේපලෙහි භුක්තිය නිසි ලෙස භාර දීමේ අයිතිය දෙවන පාර්ශවය සතු වන අතර, එම දැනුම් දීම් මසකට අඩු කාලයකින් කරයි නම් ඉදිරි එක් මසකට බදු කුලිය ගෙවීමට දෙවන පාර්ශවය බැඳී සිටී.

09. මෙම බදු ගිවිසුමේ කාලය අවසන් වීමෙන් එය දෙවන පාර්ශවය සමඟ නැවත බදු ගිවිසිමකට එළඹීමේ හෝ නොවීමේ පූර්ණ අයිතිය පළමු පාර්ශවය සතු වේ.

10. අදාළ දේපල සඳහා බදු ගාස්තුව නව තක්සේරුවක් සිදුකල විට වෙනස් විය හැකි බවට දෙවන පාර්ශවය පිළිගනී (අවුරුදු 05 කට )

11. බදු දේපල පරීක්ෂා කිරීම, අලුත්වැඩියා කිරීම හෝ වෙනත් නීත්‍යානුකූල කාර්යයන් ඉටු කිරීම සඳහා පළමු පාර්ශවය විසින් බලය පවරා ඇති නිලධාරීන් සහ/ හෝ සේවකයින්ට සාධාරණ කාලයකුට දේපලට ඇතුළු වීමේ අයිතිය ඇති බවට දෙවන පාර්ශවය පිළිගන්නා අතර, ඒ සඳහා අවසර සහ අවශ්‍ය සහයෝගය දෙවන පාර්ශවය විසින් ලබා දිය යුතුය.

12. අදාල බදු දේපලෙහි වෙනස් කිරීමක්, එකතු කිරීමක්, සවිකිරීමක් හෝ වැඩි දියුණු කිරීමක් දෙවන පාර්ශවය විසින් ලිඛිතව ඉල්ලීමක් කර පළමු පාර්ශවයේ ලිඛිත අවසරය ලබා ගත යුතු අතර, එසේ අවසර දීමේ හෝ අවසර නොදීමේ හෝ කොන්දේසි සහිතව අවසර දීමේ අයිතිය පළමු පාර්ශවය සතුය.

13. බදු දේපලෙහි පළමු පාර්ශවය අනුමත කරන ප්‍රමාණයට දෙවන පාර්ශවය විසින් තම ව්‍යාපාරික නාම පුවරු සවි කිරීම, ආලෝක කිරීම කල හැකි අතර, බාහිර පුද්ගලයින්ට හෝ ආයතනයන්ට ප්‍රචාරයක් ලබා දෙන අන්දමේ කිසිදු නාම පුවරු, බැනර්, ආලෝක කිරීම් හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම හෝ ඊට ඉඩ දීම දෙවන පාර්ශවය නොකල යුතුය.

14. දෙවන පාර්ශවය විසින් බදු දේපල හා පරිශ්‍රය පිරිසිදුවටත් සෞඛ්‍ය ආරක්ෂිතවත් බදු දේපලට හානි නොවන ආකාරයටත් පවත්වාගනෙ යා යුතුය.

15. බදු දේපලෙහි භුක්තිය භාර ගැනීමේ දී සවිකිරීම, විදුලි රැහැන්, ජල සැපයුම්, විදුලි උපකරණ (මනු මීටර) යථා තත්වයෙන් පවතින බවට පරීක්ෂා කර බලා නිවැරදි බවට සහතිකයක් දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවට ලබා දිය යුතු අතර, බදු දේපලට හානි සිදුවිය හැකි විදුලිය, නළ ජලය, වැසි ජලය වැනි කාන්දුවී ඇත්නම් පළමු පාර්ශවය ලවා සාධාරණ කාලයක් තුල නිවැරදි කරවා ගැනීමෙන් පසු එම සහතිකය ලබා දිය යුතුය.

16. ව්‍යාපාරික කටයුතු සම්බන්ධව තම වෙළඳ භාණ්ඩ ගබඩා කිරීමත්, ගෘහ උපකරණ හා ඉලෙක්ට්‍රොනික උපකරණ සවිකිරීමත් නියමිත ප්‍රමිතීන් යටතේ ආරක්ෂක විධි විධාන ඇතිවම සිදුකළ යුතු අතර, ඒවාට සහ බදු දේපල සිදු විය හැකි හානි පූර්ණ කර ගැනීම සඳහා නිසි රක්ෂණාවරණ ලබා ගැනීමේ පූර්ණ වගකීම දෙවන පාර්ශවය සතු වේ.

17. බදු දේපල වාසස්ථානයක් වශයෙන් හෝ ගබඩාවක් වශයෙන් දෙවන පාර්ශවය විසින් යොදා නොගත යුතු අතර, පළමු පාර්ශවය විසින් කලින් කලට නියම කරන දින වල හා වෙලාවන්හි හැර අන් දින වල ...................... සිට ...................... දක්වා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ අයිතිය දෙවන පාර්ශවයට හිමි වේ.

18. ව්‍යාපාර වෙලාවන් තුල බදු දේපල පරිශ්‍රයේ සේවය කරන සේවක නාම ලැයිස්තුවක් භුක්තිය භාර ගෙන දින 07 තුල දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවයට ලබා දිය යුතු අතර, ව්‍යාපාරික වේලාවන් පසු කිසිවෙකු එම පරිශ්‍රයේ රැඳී නොතිබිය යුතු අතර, පළමු පාර්ශවයේ ලිඛිත අවසරය ඇතිව බදු දේපළ හා වෙළඳ භාණ්ඩ ආරක්ෂාව සහ ආරක්ෂකයින්/මුරකරුවන් යොදා ගැනීමේ අයතිය දෙවන පාර්ශවය සතු වේ.

19. බදු දේපළ වලට බද්දට පිහිටා තිබෙන පදික වේදිකා, මහා මාර්ග කාණු පද්ධති අවහිර වන සේ වෙළඳ භාණ්ඩ අසුරා තැබීම හා/හෝ දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම දෙවන පාර්ශවය නොකළ යුතුය.

20. බදු දේපළ පිහිටි පරිශ්‍රය තුළ නවතා තැබීම දෙවන පාර්ශවය විසින් නොකළ යුතු අතර ව්‍යාපාරික භාණ්ඩ ප්‍රවාහනය කරන රථ වලට එම කටයුතු සඳහා පමණක් පරිශ්‍රයට ඇතුල් වීමට දෙවන පාර්ශවයට අවසර ඇත.

21. පළමු පාර්ශවයට දන්වා ලිඛිත අවසරයකින් තොරව මාස තුනකට වැඩි කාලයක් ව්‍යාපාර කටයුතු නොකර දෙවන පාර්ශවය විසින් අදාළ දේපළ වසා තැබුව හොත් මෙම ගිවිසුම අවලංගු වේ.

22. ජලය හා/හෝ විදුලි සැපයුම් ලබා දී නොමැති විට ඒවා ලබා දී පළමු පාර්ශවය වියදම් දරන්නේ නම් තක්සේරුවට අනුව වැඩි වන බදු ගෙවීමට දෙවන පාර්ශවය බැඳී සිටින අතර, දෙවන පාර්ශවය විසින් එම වියදම් දරන්නේ නම් වර්ෂ ................ කට එකඟ වූ බදු කුලිය යටතේම ව්‍යාපාර පවත්වාගෙන යා හැක. එසේම මාසික විදුලි බිල හා ජල ගාස්තුව හිගයකින් තොරව ගෙවීමට දෙවන පාර්ශවය බැඳී සිටී.

23. දේපළ නිසි පරිදි පවත්වාගෙන යාමේ වගකීම දෙවන පාර්ශවය සතු වන අතර රු. ................ දක්වා වන සුළු නඩත්තු වියදම් දෙවන පාර්ශවය විසින් සිදු කර ගත යුතුවේ.

24. බදු දේපළ වෙනත් පාර්ශවයකට කුවිතාන්සි මත අතුරු බදු දීම, උකස් කිරීම විකිනීම හෝ වෙනත් ගනුදෙනුවක් දෙවන පාර්ශවය විසින් නොකළ යුතුය.

25. ස්වභාවික හේතූන් නිසා අදාළ දේපළට හා පළමු පාර්ශවය විසින් සවි කර ඇති උපකරණ වලට සිදු වන හානි ප්‍රතිපූරණය කිරීම පළමු පාර්ශවය සතු වේ.

26. දෙවන පාර්ශවය විසින් අදාළ බදු දේපළ කිසිදු නීති විරෝධි ක්‍රියාවක් සඳහා යොදා නොගත යුතු අතර වෙනත් අයකුට ආධාර හෝ අනුබල නොදිය යුතුය.

27. මෙම දේපළට අදාළ ගිවිසුම ක්‍රියාත්මකව පවතිද්දී දෙවන පාර්ශවය මිය යාම හෝ අකර්මන්‍ය වීම දෙවන පාර්ශවයේ කාලාත්‍රයෙක් දරුවෙක් උරුමකරුවෙක් පොල්මකරුවෙක් අද්මිනිස්ත්‍රාසිකාර බලකරුවෙක් එය දැනුම් දිය යුතු අතර එසේම ව්‍යාපාර කටයුතු දිගටම පවත්වාගෙන ඔවුන්ගෙන් යමෙකු ඉල්ලා සිටිය හොත් ගිවිසුමේ සඳහන් ඉතිරි කාලයේ එසේම පවත්වාගෙන යාමට ඉඩ දීම ඉඩ නොදීම නව ගිවිසුමක් යටතේ අවසර දීමේ අයිතිය පළමු පාර්ශවය සතුවේ.

28. බදු කාලය අවසන් වීමෙන් හෝ ගිවිසුමේ කොන්දේසියක් කඩ වීමෙන් ගිවිසුම අවලංගු වන හෙයින් පළමු පාර්ශවය විසින් බලය දුන් අයෙකුට යථා තත්ත්වයෙන් නීත්‍යානුකූලව බදු දේපළ භාර දිය යුතු අතර හිඟ විදුලි ගාස්තු හිඟ ජල බිල්පත් ගාස්තු සහ බදු දේපළට හානි සිදු වී ඇත්නම් එම සියලු මුදල් ආපසු ගෙවන තැන්පත් මුදලෙන් අඩු කර ඉතිරි මුදල් ආපසු ගෙවන අතර එම තැන්පත් මුදලට වඩා වැඩි මුදලක් අය කර ගැනීමට ඇත්නම් එම මුදල පළමු පාර්ශවයට ගෙවීමට දෙවන පාර්ශවය බැඳී සිටී.

29. ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව මාසික බදු කුලිය දෙවන පාර්ශවය විසින් නියමිත දිනයට නොගෙවීම හේතු කොටගෙන එකී බදු මුදල සති දෙකක් ඇතුලත පළමු පාර්ශවය වෙත ගෙවන ලෙස ලිඛිත දැනුම් දීමක් කිරීමෙන් පසු දෙවන පාර්ශවය එම ඉල්ලීම කඩ කරනු ලැබූ අවස්ථාවකදී දෙවන පාර්ශවය සතු දේපළ තහනමට ගෙන අදාළ කුලී මුදල අය කර ගැනීම සඳහා පළමු පාර්ශවයට හිමි කම් තිබෙන බව දෙවන පාර්ශවය පිළිගනී.

30. දෙවන පාර්ශවය විසින් ගිවිසුමේ කොන්දේසි එකක් හෝ කීපයක් උල්ලංඝණය කිරීම හේතු කොට ගෙන ගිවිසුම අවලංගු නොකිරීමට හේතු විමසා ඉන්පසු පිළිගත හැකි හේතු මත ගිවිසුම අවලංගු කිරීම පළමු පාර්ශවයට හිමිකම තිබෙන බවද ගිවිසුම අවලංගු කිරීමෙන් පසු එම භුක්තිය ආපසු භාර දෙන ලෙසට දන්වා දින 14 කට පසු එහි භුක්තිය සාමකාමීව ආපසු ලබා නොදෙන්නේ නම් ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් සේවකයන් හෝ බලය ලත් අයවලුන්ට අදාළ පරිශ්‍රයට ඇතුළුව එහි සන්තකය ලබා ගත හැකි බවට දෙවන පාර්ශවය පිළිගන්න අතර එහිදී පළමු පාර්ශවයට එරෙහිව කිසිදු වන්දියක් ගත නොහැකි බවටද පිළිගනී.

31. තවද මෙම බදු ගිවිසුමට පාර්ශව එළඹීමත් සමඟ මීට පෙර පාර්ශව අතර ඇති කර ගත් සියලු බදු ගිවිසුම් අවලංගු වන බව දෙපාර්ශවයම පිළිගනී.

32. තවද ගිවිසුමට අදාළ කඩ කාමරයට අයත් ඉඩමේ නව කඩ පද්ධතියක් පිහිටුවන බවට පළමු පාර්ශවය විසින් දෙවන පාර්ශවයට දැන්වීම් කර මසක් ඇතුලත ඉන් දෙවන පාර්ශවයට ඉවත් විය යුතු අතර, ඒ වෙනුවට විකල්ප කඩ කාමරයක් ලැබීමේ අයිතිය දෙවන පාර්ශවයට නොමැත.

33. තවද මෙම කඩ කාමරය වසර හයෙන් හයට ටෙන්ඩර් කරනු ලබන බව දෙවන පාර්ශවය පිළිගනී.

34. බදු ගැනුම්කරුට කිසිදු අවස්ථාවක කඩ කාමරය හෝ එය පිහිටා ඇති ඉඩම භුක්තිය මත අයිතිකරගත නොහැකි බවට බදු ගැනුම්කරු පිළිගනී.

35. බදු ගැනුම්කරුට නව කඩ කාමර පද්ධතියක කඩ කාමරයක් ලැබීමේ අයිතිය හිමිවන්නේ ටෙන්ඩර් පරිපාටියකින් ඉදිරිපත්වීම මත බවත් කලින් කඩ කාමරයක හිමිකම දැරූ කාරණය මත නව කඩ කාමරයකට හිමිකමක් නොලැබෙන බවත් බදු ගැනුම්කරු පිළිගනී.

<u>ඉහත කී උප ලේඛනය</u>

ඊට සාක්ෂි පිණිස ඉහත කී බදු දීමනා කාල .............. ප්‍රාදේශීය සභාව හා බදු ගැනුම් කාර ........................................................................................................ යන දෙපක්ෂයම මෙයටත් මේ හා සමාන තවත් ලියවිලි .............................. වර්ෂ ................ක් වූ ......................මස .............. දින ......................................දී අත්සන් තබන ලදී.

................................ ................................ ................................

බදු දීමනාකරු සභාපති

බදු දීමනාකරු, ලේකම්.

බදු ගැනුම්කරු

සාක්ෂි

01. ........................................

02. ........................................

මා ඉදිරිපිටදීය.

ප්‍රසිද්ධ නොතාරිස් තැන

**ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී ඊ.ආර් සුමනාවතී මිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා.**

දැනට සභාවේ තිබෙන බදු ගිවිසුම යාවත්කාලීන නැති බැවින් අලුතින් බදු ගිවිසුමක් හදන ලෙස ගිය සභා වාරයේදී අප විසින් පවසා සිටින නමුත් සභාවේ නිලධාරීන් විසින් පරණ කොහේදෝ තිබුණ ගිවිසුමක් නීතිඥ මහතාට යොමු කර ඇති බව හැඟී යන බවත් නීතිඥ මහතා පොඩි පොඩි අඩු පාඩු ටිකක් සකස් කර නැවත එය එවා ඇති බවත් පෙන්වා දෙන ලදී. අප විසින් පවසා සිටියේ මෙය නොවන බවත් පොදු වෙළඳ පොලේ ව්‍යාපාරිකයින් සිතාගෙන සිටින්නේ අවුරුදු 25 ක් 30 ක් ගිය පසු ඔවුනට එය අයිති බවයි. නැවත ටෙන්ඩර් කළ පසු ගන්නා පුද්ගලයාද සිතාගෙන සිටින්නේ එය සභාවේ නොවෙයි ඔහුට අයිති දේපළක් ලෙස බවයි. ඒනිසා ඒවාට සුදුසු වගන්ති මෙම ගිවිසුමට ඇතුලත් විය යුතු බව ප්‍රකාශ කරන ලදී. මේ පොදු වෙළඳපොළ කඩා ඉවත් කර නැවත අලුතින් හැදිය යුතු යැයි අප යෝජනා කළ බවත් එය ඒ ලෙස කඩා ඉවත් කර හැදීමට සිදුවුව හොත් කඩ අයිති අය මේකෙන් ඉවත් වෙන්නට බැහැ යැයි පැවසුවහොත් කඩ හිමියා පැවසුවහොත් ඔවුන් ගිවිසුම් ගත වී සිටින බවත් එවිට මේ ගිවිසුමේ එයට අදාළව වගන්ති නිවැරදිව සටහන් වී තිබිය යුතු බවත් එසේ නිවැරදිව වගන්ති සටහන් වී තිබුණොත් සභාවට ප්‍රශ්නයක් නොවන බවත් ප්‍රකාශ කරන ලදී. මේ ගිවිසුමේ සඳහන් විය යුත්තේ කඩ කාමර ඉවත් කර අලුතින් හදන අවස්ථාවකදී කඩ හිමියන් මෙම කඩ කාමර වලින් ඉවත්විය යුතු බව පැහැදිළිව සඳහන් විය යුතු බව ප්‍රකාශ කරන ලදී. ඒ ඉවත් වීමට ඔවුන් බැඳී සිටින බව සඳහන් විය යුතු බවත් එය ඉවත් වන අවස්ථාවේදී අනුප්‍රාප්තික ස්ථාන ලබා දීමට සභාව බැඳී නැති බව සඳහන් විය යුතු බව පෙන්වා දෙන ලදී. එසේම එම කඩ කාමර හදා ඉවර වූ පසු එම කඩහිමියන්ටම ලබා දීමට නියමයක් නැති බවත් ටෙන්ඩර් කිරීම සිදු කරන බවත් පැහැදිළිව සටහන් විය යුතු බව පෙන්වා දෙන ලදී. මේ ටික පැහැදිළිව කියූ බවත් එය සිදු නොවීම සම්බන්ධව කණගාටු වන බවත් ප්‍රකාශ කරන ලදී. එමනිසා එම ඉහතින් ප්‍රකාශ කරන ලද වගන්ති ටික ඇතුලත් කර නැවත ගිවිසුම සකස් කළ යුතු බව ප්‍රකාශ කරන ලදී. තවද කඩ කාමර ටෙන්ඩර් කිරීමේදී අවම මිල රු. 5000.00 ක් විය යුතු බවද ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිතුමා.**

බදු ගිවිසුමේ පෙන්වා දී ඇති අඩු පාඩු සකස් කර නීතිඥ මහතා වෙත යැවීම සිදු කර මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව බදු ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු යොදන බව ප්‍රකාශ කරන ලදී.

**ඉහත යෝජනා අංක 05/2022/08 (02) මඟින් ඉදිරිපත් කරන ලද බදු ගිවිසුම සඳහා පහත කරුණු ඇතුලත් කිරීමට තීරණය විය. ඒ අනුව,**

**1. කඩ භූමි නව කඩ පද්ධතියක් ඉදි කිරීමේදී දැනුම්දී මසක් ඇතුලත ඉන් ඉවත් විය යුතුය. ඒ සඳහා විකල්ප ස්ථාන ලබා දීමට සභාව එකඟ නොවේ.**

**2. සෑම වසර 6 කට වරක් සියළු කඩ කාමර ටෙන්ඩර් කල යුතුය.**

**3. දැනට ගිවිසුම් ගත බදු ගිවිසුම අහෝසි කල යුතුය.**

**4. කිසිදු අවස්ථාවක ප්‍රවේණි අයිතියක් සිදු නොවේ.**

**5 . නව කඩ පද්ධතියක් සැකසීමේදී මින් ඉහත බදු කරුවන් වෙතම ලබා දීමට සභාව එකඟ නොවේ . එහිදී සිදුවන නව ටෙන්ඩර් කිරීමේදී ඔවුන් විසින් ටෙන්ඩර් අයදුම් කල යුතුය.**

තවද ප්‍රාදේශිය සභාව සතු කඩ කාමර සම්බන්ධයෙන් පහත තීරණද ගනු ලැබීය.

1. සියළු බදු කරුවන් ගිවිසුම අත්සන් කල යුතුය.
2. වර්ෂ 03 කට ගිවිසුම් ගතවිය යුතුය.
3. ටෙන්ඩර් කිරීමේ අවම ලංසුව
    - උහන කඩ කාමර රු.6000.00
    - වැරැන්කැටගොඩ කඩ කාමර ඉහල මාලය රු.5000.00
    - වැරැන්කැටගොඩ කඩ කාමර පහල මාලය රු.7000.00

ඉහත කඩ ගිවිසුමට ඉහතින් තීරණය කරගත් අංක1 සිට 5 දක්වා කරුණු ඇතුලත් කර ගිවිසුම සකස් කර සභාවේ නීතිඥ වෙත ඉදිරිපත් කර නැවත පරීක්ෂාකර සකස් කරන ලද ගිවිසුම, මූල්‍ය ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කර අනුමැතියෙන් ඉදිරියේදී සභාව සතු කඩ කාමර බදු දීම සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට තීරණය විය. ඉහත තීරණ සදහා එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සම්මත විය.

**06.** කාරක සභාවල වාර්තා - නැත

**07.2022** ජූලි මස ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම

## ආදායම් විග්‍රහය -2022 ජූලි

| | | | | |
|---|---|---|---|---|
| 01. පොදු පරිපාලන | වරිපනම් | රු: | | |
| | ව්‍යාපාර බදු | රු: | 46,800.00 | |
| | බයිසිකල් | රු: | | |
| | විථිරේබා සහතික | රු: | | |
| | වරිපනම් දඩ | රු: | | |
| | වරිපනම් දඩ/උසාවි දඩ | රු: | | |
| | පොලී | රු: | 17,794.31 | |
| | පෝරම ගාස්තු | රු: | 1,700.00 | |
| | අභ්‍යන්තර බිල්කිරීම් | රු: | | |
| | සේවක ණය පොළි | රු: | 15,099.44 | |
| | වැටුප් ප්‍රතිපූර්ණය | රු: | 2,123,620.56 | |
| | **එකතුව** | රු: | | **2,205,014.31** |
| 02.සෞඛ්‍ය සේවා | වෙළඳ බලපත්‍ර | රු: | 50,750.00 | |
| | ව්‍යාපාර බදු | රු: | | |
| | පරිසර බලපත්‍ර | රු: | 12,000.00 | |
| | පරිසර බලපත්‍ර පරීක්ෂාව | රු: | 2,000.00 | |
| | සුනඛ එන්නත් | රු: | | |
| | වැටුප් ප්‍රතිපූර්ණය | රු: | 349,460.35 | |
| | **එකතුව** | රු: | | **414,210.35** |
| 03.භෞතික සැලසුම් | ගෙවල් කුලී | රු: | | |
| | කුලියට දීම (වාහන) | රු: | | |
| | කුලියට දීම් (භූමිය) | රු: | | |
| | දීර්ඝ කාලීන බලපත්‍ර | රු: | | |
| | ගොඩනැගිලි පරීක්ෂාව | රු: | 5,000.00 | |

| | | | | |
|---|---|---|---|---|
| | සැලසුම් ශිල්පීන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | රු: | | |
| | අයකර ගතහැකි ගාස්තු | රු: | | |
| | වැටුප් ප්‍රතිපූර්ණය | රු: | 406,139.00 | |
| | **එකතුව** | රු: | | **411,139.00** |
| 04.ජල සේවා | ජල බවුසරය | රු: | | |
| | නල ළිං | රු: | | |
| | **එකතුව** | රු: | | **-** |
| 05.උපයෝගී සේවා | කඩකාමර කුලි (උහන, වැරැන්කැටගොඩ) | රු: | 116,980.17 | |
| | මස්කඩ | රු: | | |
| | පොල බදු | රු: | 68,060.00 | |
| | අයකර ගතහැකි ගාස්තු | රු: | | |
| | පොළ/කඩකාමර ප්‍රමාද ගාස්තු | රු: | 4,642.00 | |
| | **එකතුව** | රු: | | **189,682.17** |
| 06.සුභසාධන සේවා | විනෝද බදු | රු: | | |
| | ප්‍රචාරක දැන්වීම් පුවරු | රු: | | |
| | ගවයන් ඇල්ලීම | රු: | | |
| | පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු | රු: | | |
| | වැටුප් ප්‍රතිපූර්ණය | රු: | 133,770.00 | |
| | **එකතුව** | රු: | | **133,770.00** |
| 07.විදුලිය | වැටුප් ප්‍රතිපූර්ණය | රු: | | |
| | **එකතුව** | රු: | | **-** |
| | පුනරාවර්තන ආදායම් එකතුව | | | **3,353,815.83** |
| | ප්‍රාග්ධන ආධාර | | 400,000.00 | **400,000.00** |
| | **එකතුව** | | | **3,753,815.83** |
| වෙනත් ලැබීම් | පුස්තකාල තැන්පත් | රු: | 600.00 | |
| | සේවක ණය | රු: | 113,500.00 | |
| | විවිධ තැන්පත් | රු: | 21,484.80 | |
| | ටෙන්ඩර් තැන්පත් | රු: | | |
| | මුද්දර තැන්පත් | රු: | 7,950.00 | |
| | වැටුප් තැම්පත් | රු: | | |
| | අත්තිකාරම් පියවීම | රු: | 14,720.00 | |
| | මුදල් මාරු | රු: | | |
| | ණය ගැති | රු: | | |
| | **එකතුව** | රු: | | **158,254.80** |
| | **මුළු එකතුව** | | | **3,912,070.63** |

## උහන ප්‍රාදේශිය සභාවේ මාසික ඒකාබද්ධ වැය සාරාංශය
## 2022 ජූලි මාසය

| | | |
|---|---|---|
| **1** | **අතිකාල ගෙවීම** | |
| | 01. ඒ. ප්‍රියන්ත කුමාර මයා (2022 ජුනි මස පැය 75 ක් සඳහා) | 8,749.50 |
| | 02. ආර්.කේ.ජේ.වික්‍රමසිංහ මයා (2022 ජුනි මස පැය 54 ක් සඳහා) | 6,747.30 |
| | 03. එච්.ඊ. සරත් කුමාර මයා (2022 ජුනි මස පැය 60 ක් සඳහා) | 6,499.80 |

| | | |
|---|---|---|
| | 04. කේ.පී. සුගත් සමරවීර මයා (2022 ජුනි මස පැය 60 ක් සඳහා) | 6,499.80 |
| | 05. කේ.පී. සුගත් සමරවීර මයා (2022 මැයි මස පැය 51.5 ක් සඳහා) | 5,578.99 |
| | 06. වී.ඒ.අජිත් කුමාර මයා (2022 මාර්තු මස පැය 20 ක් සඳහා) | 2,062.40 |
| | 07. එල්.ආර්.සම්පත් මයා (2022 මාර්තු මස පැය 20 ක් සඳහා) | 2,166.60 |
| | 08. එම්. ක්‍රිෂ්ණන් මයා (2022 ජුනි මස පැය 19.30 ක් සඳහා) | 2,414.68 |
| | 09. කේ. රාසනායගම් මයා (2022 ජුනි මස පැය 19.30 ක් සඳහා) | 2,254.59 |
| | 10. ඊ. ඉලංගෝ මයා (2022 ජුනි මස පැය 19.30 ක් සඳහා ) | 2,274.87 |
| | 11. ඩබ්.ඒ. අමින්ද තුසිත මයා (2022 අප්‍රේල් මස පැය 20 ක් සඳහා | 2,724.00 |
| **2** | **ජල බිල්පත් පියවීම** | |
| | 01. උහන ප්‍රධාන කාර්යාලය (2022.07.08 දින සිට) | 5,430.51 |
| | 02. උහන පොලිසිය අසල ජල කාරාමය (2022.07.04 දක්වා) | 708.03 |
| | 03. උහන පොදු වෙළඳ පොළ මාළු ලෑල්ල (2022 ජූලි දක්වා) | 2,390.45 |
| | 04. උහන පොදු වැසිකිළිය (2022.07.10 දින සිට) | 3,299.89 |
| | 05. ගොනාගොල්ල පොදු වෙළඳ පොළ (2022 ජූලි) | 1,672.16 |
| | 06. වීරගොඩ පොළ (ජූලි දක්වා ) | 308.00 |
| | 07. වැරැන්කැටගොඩ පොළ (2022.03.06-2022.06.06 දක්වා ) | 8,800.96 |
| | 08. ගොනාගොල්ල මහජන පුස්තකාලය (2022 ජූලි 17 දක්වා) | 495.27 |
| | 09.ගොනාගොල්ල මහජන පුස්තකාලය (2022.03.18-2022.07.06 දක්වා) | 8,627.34 |
| | 10.ගොනාගොල්ල පොළ (2022.03.28-2022.06.26 දක්වා) | 7,922.18 |
| **3** | **දුරකථන බිල්පත් පියවීම** | |
| | 01. 0632250355 ( 2022.06.01-2022.06.30 දක්වා ) | 6,612.64 |
| **4** | **විදුලි බිල්පත් පියවීම** | |
| | 01. වීරගොඩ නව පුස්තකාලය (2022.05.22-2022.06.27) | 240.00 |
| | 02. වීරගොඩ මහජන පුස්තකාලය (2022.06.03-2022.07.07) | 404.70 |
| | 03. ගොනාගොල්ල නිල නිවස (2022.05.05-2022.06.05) | 30.00 |
| | 04. ගොනාගොල්ල නිල නිවස (2022.06.05-2022.07.07) | 30.00 |
| | 05. ගොනාගොල්ල මහජන පුස්තකාලය (2022.05.04-2022.06.04) | 459.60 |
| | 06. උහන මහජන පුස්තකාලය (2022.06.02-2022.07.02) | 898.80 |
| | 07. උහන ප්‍රධාන කාර්යාලය (2022.06.02-2022.07.02) | 18,040.15 |
| 5 | 01. ඒ.පී.ප්‍රදීප් පත්මචන්ද්‍ර මයා (2022 ජුනි මස දෛනික වැටුප් ගෙවීම) | 20,898.94 |
| | 02. ටී.පී.ඩී. හේමමාලි රණවීර මිය (2022 ජුනි මස දෛනික වැටුප් ගෙවීම) | 472.40 |
| | 03. එච්.එම්. ප්‍රදීප් සඳකැලුම් මයා (2022 ජුනි මස දෛනික වැටුප් ගෙවීම) | 30,377.35 |
| | 04. ඩී.එම්. දිලාන් තනුජ මයා (2022 ජුනි මස දෛනික වැටුප් ගෙවීම) | 22,093.41 |

| | | |
|---|---|---|
| | 05. ඒ.ආර්.ඩී.පී.සී. බණ්ඩාර මයා (2022 ජුනි මස දෛනික වැටුප් ගෙවීම) | 28,310.51 |
| | 06. සේවක අර්ථසාධක අරමුදල (දෛනික වැටුප් අවකරණ) | 23,957.03 |
| | 07. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (දෛනික වැටුප් අවකරණ) | 3,593.53 |
| | 08. ප්‍රාදේශිය සභා සුභ සාධක සංගමය (දෛනික වැටුප් අවකරණ) | 1,700.00 |
| | 09. ආර්.එම්. නවීන් සදිප බංඩාර මයා (ජුනි මස පරිගණක පුහුණු දීමනාව ගෙවීම) | 9,500.00 |
| **6** | **වවුචර් ගෙවීම්** | |
| | 01. ටී.පී.යු.පී. විජේවර්ධන මයා (ගරු සභාපතිතුමාගේ දුරකතන බිල්පත පියවීම 2022.06.15-2022.07.14 දක්වා) | 3,000.00 |
| | 02. ඒ.එච්.එම් ෆාරිස් මයා (කාර්යාලිය ජායා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම වෙනුවෙන්) | 24,400.00 |
| | 03. ලේකම්, ප්‍රාදේශිය සභාව, උහන (වගා කටයුතු සඳහා බීජ ලබා ගැනීම) | 4,700.00 |
| | 04. ලේකම්, ප්‍රාදේශිය සභාව, උහන (උහන ප්‍රාදේශිය සභාවේ ගෙවත්ත සඳහා බීජ ලබා ගැනීම වෙනුවෙන් අත්තිකාරම් මුදලක් ලබා ගැනීම) | 2,500.00 |
| | 05. ලේකම්, ප්‍රාදේශිය සභාව, උහන (ගෙවතු වගාව සඳහා පොහොර ලබා ගැනීම) | 5,000.00 |
| | 06. ලේකම්, ප්‍රාදේශිය සභාව, උහන (සුළු මුදල් ඉල්ලීම) | 4,609.00 |
| | 07. ලේකම්, ප්‍රාදේශිය සභාව, උහන (ඉන්ධන ලබා ගැනීම සඳහා අත්තිකාරම් ලබා ගැනීම) | 152,720.00 |
| | 08. ලේකම්, ප්‍රාදේශිය සභාව, උහන (උහන ප්‍රාදේශිය සභාවේ වගාව සඳහා සතියකට අවශ්‍ය බෙහෙත් වර්ග ලබා ගැනීම වෙනුවෙන් අත්තිකාරම් මුදලක් ලබා ගැනීම) | 3,000.00 |
| | 09. කේ.ඒ.සරත් ගුණසේකර (2022.04.01-2022.04.20) ලබා ගත් ඉන්ධන සඳහා ගෙවීම) | 21,120.00 |
| | 10. එච්.එම්.ප්‍රදිප් සඳකැලුම්( මෙම ආයතනයට අයත් PE -8373 කැබ් රථය සඳහා අතින් මුදල් ගෙවා ලබා ගත් ඉන්ධන සඳහා ප්‍රතිපූර්ණය කිරීම | 14,720.00 |
| | 11. ලේකම්, ප්‍රාදේශිය සභාව, උහන (ඩී.එම්.කේ.ටී.දසනායක මහතාගේ වැටුපෙන් අයකරන ලද මුදල නැවත ගෙවීම | 200.00 |
| | 12. ආර්.පී.වික්‍රමආරච්චි මයා (ආපදා ණය ගෙවීම) | 100,000.00 |
| | 13. වී.ඒ.අජිත් කුමාර මයා(ආපදා ණය ගෙවීම) | 100,000.00 |
| | 14. ලේකම්, ප්‍රාදේශිය සභාව, උහන(කොරෝනා අරමුදල සඳහා දිනක වැටුපක් පරිත්‍යාග කල අයට නැවත එම මුදල ගෙවීම) | 18,084.89 |
| | 15. සභාපති - UB 10/11 බෙදුම් ඇළ ගොවි සංවිධානය (ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහනට අදාළව ප්‍රධාන ඇළ මාර්ගයේ සිට 21/104 අසලන් ඉදිරියට මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියට අදාළව ගෙවීම් සිදු කිරීම) | 412,759.37 |
| | 16. ඒ.පී.සුදත් ගුණතිලක මයා (2022 ජුනි මස මාසික සභා රැස්වීම සඳහා සහභාගී වූ මන්ත්‍රීවරුන්ට උදෑසන කෙටි ආහාර සැපයීම හා ප්‍රසම්පාදන කමිටුවට සංග්‍රහ කිරීම) | 3,710.00 |
| **7** | ස්ථිර වැටුප් (ජුලි මස) | 2,499,308.56 |
| **8** | මන්ත්‍රී දීමනා (ජුලි මස) | 465,000.00 |
| | එකතුව | 4,090,078.20 |

**හරස් සටහන්**

| | |
|---|---|
| | 88,613.94 |
| **මුළු එකතුව** | **4,178,692.14** |

**08.2022** ජූලි මස ධාවන සටහන් ඉදිරිපත් කිරීම

**2022 ජූලි මස ධාවන සටහන් විස්තරය LL - 7523 කෲ කැබ් රථය**

| දිනය | සිදු කළ කාර්යය | ලබා ගත් ඉන්ධන ප්‍රමාණය | පසු ගිය මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | ධාවනය කළ කි.මී. පැ.මී. |
|---|---|---|---|---|
| | | | **63 L** | |
| 2022.07.01 | ප්‍රා.ස. සිට වළගම්පුර වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත නැවත අම්පාර වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 42 |
| 2022.07.04 | ප්‍රා.ස. සිට ගලහිටියාගොඩ වෙත ගොස් වෙත ගොස් ආපසු උහන හා උහන අවට ආපසු ප්‍රා.ස. වෙත | | | 14 |
| 2022.07.05 | ප්‍රා.ස. සිට අම්පාර වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 28 |
| 2022.07.06 | ප්‍රා.ස. සිට අම්පාර බුද්ධංගල වීරගොඩ කුමාරිගම සභා වාර්තා ලබා දීම සඳහා ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.07.07 | ප්‍රා.ස. සිට දෙමටමල්පැලැස්ස වෙත ගොස් ඒ අවට වීථි ලාම්පු නඩත්තු කටයුතු සිදු කර ආපසු ප්‍රා.ස. වෙත | | | 35 |
| 2022.07.08 | ප්‍රා.ස. සිට උදයපුර අවට වීථි ලාම්පු නඩත්තු කර ආපසු ප්‍රා.ස. වෙත | | | 42 |
| 2022.07.13 | ප්‍රා.ස. සිට වළගම්පුර වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 21 |
| 2022.07.14 | ප්‍රා.ස. සිට වළගම්පුර වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 21 |
| 2022.07.15 | ප්‍රා.ස. සිට වළගම්පුර වෙත ගොස් ආපසු මහකණ්ඩිය වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 35 |
| 2022.07.18 | ප්‍රා.ස. සිට වළගම්පුර වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 21 |
| 2022.07.21 | ප්‍රා.ස. සිට වළගම්පුර වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 21 |
| 2022.07.22 | ප්‍රා.ස. සිට වළගම්පුර වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත ආපසු අම්පාර හා ඒ අවට ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 42 |
| 2022.07.26 | ප්‍රා.ස. සිට සියනෑ ස්ටෝර්ස් හා උහන අවට ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 14 |
| | මේ මස ලබා ගත් ඉන්ධන | **-** | | |
| | මුළු ඉන්ධන ප්‍රමාණය | | **63 L** | |
| | වැය වූ ඉන්ධන ප්‍රමාණය හා ධාවනයේ යෙදී ඇති පැ.මී. ගණන (ඉන්ධන ලීටර් 01 කින් කි.මී. 07 ක් ධාවනය කළ හැකිය. මෙම මස කි.මී. 406 ක් ධාවනයේ යෙදී ඇත) | | **58 L** | **406 Km** |
| | මෙම මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | | **05 L** | |

## 2022 ජුලි මස ධාවන සටහන් විස්තරය ZB-0351 කම්පැක්ටර් රථය

| දිනය | සිදු කළ කාර්යය | ලබා ගත් ඉන්ධන ප්‍රමාණය | පසු ගිය මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | ධාවනය කළ කි.මී. පැ.මී. |
|---|---|---|---|---|
| | | | **87 L** | |
| 2022.07.01 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර එයාපෝර්ට් හන්දිය ආපසු උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උහන පොළ අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | 135 | | 42 |
| 2022.07.04 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර ආපසු උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදයගරිය වැරැන්කැටගොඩ පොළ ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 49 |
| 2022.07.05 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ පොළ ගොනාගොල්ල රජගලතැන්න නුගේලන්ද පොළ ආපසු උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.07.06 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර සිවිල් ආරක්ෂක බලකාය ආපසු උහන වීරගොඩ පාර ළමා නිවාස පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදයගිරිය වැරැන්කැටගොඩ ගොනාගොල්ල ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.07.07 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල පොළ ආපසු උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 63 |
| 2022.07.11 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර ආපසු උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදයගරිය වැරැන්කැටගොඩ පොළ ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 49 |
| 2022.07.12 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න නුගේලන්ද පොළ පියංගල ආපසු උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.07.13 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර සිවිල් ආරක්ෂක බලකාය උහන වීරගොඩ පාර ළමා නිවාසය ඩිස්පෙන්සරිය පාර උහන නගරය වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.07.14 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල පොළ ආපසු උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 63 |
| 2022.07.15 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර එයාපෝර්ට් හන්දිය ආපසු උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උහන පොළ අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 42 |
| 2022.07.18 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර ආපසු උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදයගිරිය වැරැන්කැටගොඩ පොළ ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 49 |

| | | | | |
|---|---|---|---|---|
| 2022.07.19 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න නුගේලන්ද පොළ පියංගල ආපසු අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.07.21 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල පොළ ආපසු උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | 190 | | 70 |
| 2022.07.22 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර එයාපෝර් හන්දිය ආපසු උහන වීරගොඩ ඩිස්පෙන්සරිය පාර උහන නගරය උහන පොළ අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 63 |
| 2022.07.25 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර ආපසු උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදයගිරිය වැරැන්කැටගොඩ පොළ ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 49 |
| 2022.07.26 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න නුගේලන්ද පොළ පියංගල ආපසු අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.07.27 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර සිවිල් ආරක්ෂක බලකාය උහන වීරගොඩ පාර ළමා නිවාසය ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදයගිරිය වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.07.28 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල පොළ ආපසු උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 63 |
| 2022.07.29 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර සිවිල් ආරක්ෂක බලකාය එයාපෝර්ට් හන්දිය ආපසු උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උහන පොළ අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 42 |
| | මේ මස ලබා ගත් ඉන්ධන | **325 L** | | |
| | මුළු ඉන්ධන ප්‍රමාණය | | **412 L** | |
| | වැය වූ ඉන්ධන ප්‍රමාණය හා ධාවනයේ යෙදි ඇති කි.මී. ගණන (ඉන්ධන ලීටර් 01 කින් කි.මී. 3.5 ක් ධාවනය කළ හැකිය. මෙම මස කි.මී. 1134 ක් ධාවනයේ යෙදී ඇත) | | **324** | **1134 Km** |
| | මෙම මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | | **88 L** | |

## 2022 ජුලි මස ධාවන සටහන් විස්තරය PE-8373 කැබ් රථය

| දිනය | සිදු කළ කාර්යය | ලබා ගත් ඉන්ධන ප්‍රමාණය | පසු ගිය මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | ධාවනය කළ කි.මී. පැ.මී. |
|---|---|---|---|---|
| | | | **31 L** | |
| 2022.07.01 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස වෙත ආපසු ප්‍රා.ස. දක්වා නැවත සභාපතිතුමාගේ නිවස වෙත ආපසු ප්‍රා.ස. වෙත | 49 | | 8 |
| 2022.07.02 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත ආපසු අම්පාර සහ ඒ අවට නැවත නුගේලන්ද ආපසු ප්‍රා.ස. දක්වා ආපසු සමනබැද්ද ආපසු සභාපතිතුමාගේ නිවසට ආපසු ප්‍රා.ස. වෙත | | | 64 |

| | | | | |
|---|---|---|---|---|
| 2022.07.03 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස වෙත ආපසු ප්‍රා.ස. දක්වා නැවත අම්පාර සහ ඒ අවට නැවත ගොනාගොල්ල ආපදු උදයගිරිය අවට ආපසු සභාපතිතුමාගේ නිවස වෙත ආපසු ප්‍රා.ස. වෙත | | | 72 |
| 2022.07.04 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවිස ආපසු ප්‍රා.ස. නැවත වීරගොඩ ආපසු ප්‍රා.ස. දක්වා නැවත නුගේලන්ද ආපසු සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. වෙත | | | 64 |
| 2022.07.05 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. ආපසු රුහුණුගම සහ ඒ අවට නැවත ප්‍රා.ස. දක්වා ආපසු අම්පාර නැවත ප්‍රා.ස. දක්වා ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 80 |
| 2022.07.06 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. ආපසු ගොනාගොල්ල නවගිරියාව ආපසු ප්‍රා.ස. දක්වා නැවත උහන අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 72 |
| 2022.07.07 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු වළගම්පුර නැවත වැරැන්කැටගොඩ ආපසු ගොනාගොල්ල නැවත ප්‍රා.ස. දක්වා ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.07.08 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු උහන නගරය අවට ආපසු සේනාගම සහ ඒ අවට නැවත උහන ප්‍රා.ස. දක්වා ආපසු සභාපතිතුමාගේ නිවස වෙත ආපසු ප්‍රා.ස. වෙත | | | 32 |
| 2022.07.09 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු වළගම්පුර ආපසු ගොනාගොල්ල නැවත ප්‍රා.ස. දක්වා නැවත සමනබැද්ද නැවත සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. වෙත | | | 48 |
| 2022.07.11 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස වෙත නැවත ප්‍රා.ස. ආපසු අම්පාර සහ ඒ අවට නැවත දමන ආපසු උහන නගරය අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 80 |
| 2022.07.12 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු නුගේලන්ද ආපසු ප්‍රා.ස. දක්වා නැවත උදයගිරිය සහ ඒ අවට නැවත ප්‍රා.ස. දක්වා ආපසු මායාදුන්න නැවත අම්පාර සහ ඒ අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | 20 | | 72 |
| 2022.07.13 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු ගොනාගොල්ල ආපසු ප්‍රා.ස. දක්වා නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | 58 | | 24 |
| 2022.07.14 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත ආපසු අම්පාර සහ ඒ අවට නැවත ප්‍රා.ස. දක්වා ආපසු වළගම්පුර ගොස් සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.07.15 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු කුමාරිගම නැවත ප්‍රා.ස. සහ ආපසු අම්පාර සහ ඒ අවට නැවත සභාපතිතුමාගේ නිවස වෙත ආපසු ප්‍රා.ස. වෙත | | | 48 |
| 2022.07.16 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. නැවත හිමිදුරාව ආපසු ප්‍රා.ස. දක්වා නැවත උහන අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 40 |

| | | | | |
|---|---|---|---|---|
| 2022.07.18 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු අම්පාර සහ ඒ අවට නැවත ප්‍රා.ස. දක්වා ආපසු උහන සහ ඒ අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.07.19 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු සියඹලාවැව ආපසු ප්‍රා.ස. දක්වා නැවත අම්පාර සහ ඒ අවට ආපසු සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. වෙත | | | 80 |
| 2022.07.20 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු රජගලතැන්න සහ ඒ අවට ප්‍රා.ස. දක්වා ආපසු උහන අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. වෙත | | | 40 |
| 2022.07.21 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු හිමිදුරාව අවට ආපසු ප්‍රා.ස. දක්වා නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 32 |
| 2022.07.22 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු අම්පාර සහ ඒ අවට නැවත උහන අවට ආපසු නවගිරියාව සහ ඒ අවට නැවත ප්‍රා.ස. දක්වා ආපසු සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. වෙත | | | 64 |
| 2022.07.23 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. නැවත ගොනාගොල්ල ආපසු ප්‍රා.ස. නැවත ප්‍රා.ස. ආපසු අම්පාර නැවත සියඹලාවැව දක්වා ආපසු ප්‍රා.ස. නැවත සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. වෙත | 32 | | 72 |
| 2022.07.25 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. නැවත උහන අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 24 |
| 2022.07.26 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු සියඹලාවැව ආපසු ප්‍රා.ස. දක්වා ආපසු හිමිදුරාව ආපසු අම්පාර සහ ඒ අවට ආපසු ප්‍රා.ස. දක්වා ආපසු උහන අවට ආපසු සභාපතිතුමාගේ නිවස වෙත ආපසු ප්‍රා.ස. වෙත | | | 88 |
| 2022.07.27 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ගොනාගොල්ල ආපසු නවගිරියාව සහ ඒ අවට ආපසු උහන අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | 50 | | 40 |
| 2022.07.28 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත උහන අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 16 |
| 2022.07.29 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත සේනාගම සහ ඒ අවට ආපසු ගොනාගොල්ල නැවත ප්‍රා.ස. දක්වා නැවත උහන අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.07.30 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත අම්පාර සහ ඒ අවට ආපසු ප්‍රා.ස. දක්වා ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. වෙත | | | 48 |
| | මේ මස ලබා ගත් ඉන්ධන | **209 L** | | |
| | මුළු ඉන්ධන ප්‍රමාණය | | **240 L** | |
| | වැය වූ ඉන්ධන ප්‍රමාණය හා ධාවනයේ යෙදී ඇති කි.මී. ගණන (ඉන්ධන ලිටර් 01 කින් කි.මී. 08 ක් ධාවනය කළ හැකිය. මෙම මස කි.මී. 1432 ක් ධාවනයේ යෙදී ඇත) | | **179** | **1432 Km** |
| | මෙම මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | | **61 L** | |

**2022 ජුලි මස ධාවන සටහන් විස්තරය 252-6471 කැබ් රථය**

| දිනය | සිදු කළ කාර්යය | ලබා ගත් ඉන්ධන ප්‍රමාණය | පසු ගිය මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | ධාවනය කළ කි.මී. පැ.මී. |
|---|---|---|---|---|
| | | | **28L** | |
| 2022.07.01 | ප්‍රා.ස. සිට වළගම්පුර ගොස් නැවත ප්‍රා.ස. නැවත අම්පාර පළාත් පාලන කාර්යාලය වෙත ගොස් නැවත ප්‍රා.ස. වෙත | | | 51 |
| 2022.07.02 | ප්‍රා.ස. සිට දමිත් ඉන්ධන පිරවුම්හල වෙත ගොස් නැවත සියඹලාවැව පොළ වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත | 32 | | 34 |
| 2022.07.04 | ප්‍රා.ස. සිට අම්පාර පළාත් පාලන ආයතනය වෙත ගොස් ආපසු පුබුදු ට්‍රේඩ් සෙන්ටර් වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 34 |
| 2022.07.05 | ප්‍රා.ස. සිට වළගම්පුර වෙත ගොස් නැවත ප්‍රා.ස. ආපසු ගලපිටගල පන්සල අසළට ගොස් නැවත ප්‍රා.ස. ආපසු දමිත් ඉන්ධන පිරවුම්හල වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 51 |
| 2022.07.06 | ප්‍රා.ස. සිට නුගේලන්ද නැවත නවගිරියාව ගලපිටගල මායාදුන්න 28 හන්දිය හරහා වළගම්පුර හිම්දුරාව නැවත උහන හරහා ප්‍රා.ස. වෙත | | | 85 |
| 2022.07.07 | ප්‍රා.ස. සිට වළගම්පුර නැවත ප්‍රා.ස. අම්පාර පළාත් පාලන ආයතනය වෙත ගොස් නැවත ප්‍රා.ස. නැවත ගොනාගොල්ල පොළ නැවත ප්‍රා.ස. වෙත | | | 51 |
| 2022.07.08 | ප්‍රා.ස. සිට අම්පාර නගර සභාව හා නගර සභා කොම්පෝස්ට් ගබඩාව නැවත ප්‍රා.ස. වෙත | | | 34 |
| 2022.07.09 | ප්‍රා.ස. සිට වළගම්පුර නැවත උහන ප්‍රා.ස. වෙත නැවත ගොනාගොල්ල පුස්තකාලය ආපසු ප්‍රා.ස. වෙත | | | 34 |
| 2022.07.11 | ප්‍රා.ස. සිට අම්පාර වාරිමාර්ග දෙපාර්තමේන්තුව නැවත පළාත් පාලන ආයතනය නැවත ටෙලිකොම් ආයතනය වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 34 |
| 2022.07.12 | ප්‍රා.ස. සිට ගොනාගොල්ල, නුගේලන්ද පොළ නැවත ප්‍රා.ස. වෙත | | | 34 |
| 2022.07.14 | ප්‍රා.ස. සිට වළගම්පුර නැවත නුගේලන්ද මායාදුන්න නැවත ප්‍රා.ස. වෙත | 32 | | 51 |
| 2022.07.15 | ප්‍රා.ස. සිට වීරගොඩ වෙත ගොස් නැවත ප්‍රා.ස. වෙත නැවත වළගම්පුර ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 51 |
| 2022.07.16 | ප්‍රා.ස. සිට ගලපිටගල නැවත වළගම්පුර උහන ප්‍රා.ස. නැවත ගොනාගොල්ල නැවත ප්‍රා.ස. වෙත | | | 85 |
| 2022.07.20 | ප්‍රා.ස. සිට අම්පාර පළාත් පාලන ආයතනය වෙත හා අම්පාර අවට ආපසු ප්‍රා.ස. නැවත අම්පාර දිසාපති කාර්යාලය වෙත හා පුබුදු ආයතනය වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 51 |
| 2022.07.21 | ප්‍රා.ස. සිට වීරගොඩ පුස්තකාලය නැවත ප්‍රා.ස. ආපසු ගොනාගොල්ල නැවත ප්‍රා.ස. වෙත | | | 51 |

| | | | | |
|---|---|---|---|---|
| 2022.07.22 | ප්‍රා.ස. සිට අම්පාර IOC ඉන්ධන පිරවුම්හල වෙත ගොස් ආපසු ප්‍රා.ස. නැවත වළගම්පුර නැවත ප්‍රා.ස. වෙත | | | 34 |
| 2022.07.25 | ප්‍රා.ස. සිට ගොනගොල්ල නැවත ප්‍රා.ස. ආපසු අම්පාර ආපසු ප්‍රා.ස. නැවත වළගම්පුර නැවත ප්‍රා.ස. වෙත | 66 | | 51 |
| 2022.07.26 | ප්‍රා.ස. සිට ගලපිටගල නැවත ප්‍රා.ස. නැවත ආදල්ඔය නැවත ප්‍රා.ස. ආපසු අම්පාර වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 68 |
| 2022.07.27 | ප්‍රා.ස. සිට වඩයන්තලාව නැවත ප්‍රා.ස. නැවත නුගේලන්ද නැවත ප්‍රා.ස. ආපසු වළගම්පුර නැවත ප්‍රා.ස. වෙත | | | 85 |
| 2022.07.28 | ප්‍රා.ස. සිට අම්පාර නැවත ප්‍රා.ස. නැවත වළගම්පුර නැවත ප්‍රා.ස. වෙත | | | 51 |
| 2022.07.29 | ප්‍රා.ස. සිට ආදල්ඔය නැවත ප්‍රා.ස. නැවත නුගේලන්ද ආපසු ප්‍රා.ස. නැවත අම්පාර නැවත ප්‍රා.ස. ආපසු වළගම්පුර නැවත ප්‍රා.ස. වෙත | | | 102 |
| 2022.07.30 | ප්‍රා.ස. සිට අම්පාර නැවත ප්‍රා.ස. නැවත ගොනාගොල්ල වළගම්පුර ආපසු ප්‍රා.ස. වෙත | | | 51 |
| | මේ මස ලබා ගත් ඉන්ධන | **130 L** | | |
| | මුළු ඉන්ධන ප්‍රමාණය | | **158 L** | |
| | වැය වූ ඉන්ධන ප්‍රමාණය හා ධාවනයේ යෙදී ඇති කි.මී. ගණන (ඉන්ධන ලීටර් 01 කින් කි.මී. 08.5 ක් ධාවනය කළ හැකිය. මෙම මස කි.මී. 1173 ක් ධාවනයේ යෙදී ඇත) | | **138 L** | **1173 Km** |
| | මෙම මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | | **20 L** | |

## 2022 මැයි මස ධාවන සටහන් විස්තරය ZA-3749 බැකෝ ලෝඩරය

| දිනය | සිදු කළ කාර්යය | ලබා ගත් ඉන්ධන ප්‍රමාණය | පසු ගිය මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | ධාවනය කළ කි.මී. පැ.මී. |
|---|---|---|---|---|
| 2022.05.17 | ප්‍රා.ස. සිට දමිත් ඉන්ධන පිරවුම්හල දක්වා ආපසු ප්‍රා.ස. වෙත | 115 | | 0.50 |
| | ආපසු සභාව අසළ ගස් ගැලවීම හා කසළ පැටවීම ආපසු ප්‍රා.ස. වෙත | | | 2.50 |
| 2022.05.18 | ප්‍රා.ස. සිට සභාව අසළ වැට සුද්ද කිරීම ආපසු ප්‍රා.ස. දක්වා | | | 1.30 |
| 2022.05.19 | ප්‍රා.ස. සිට සභාව ඉදිරිපිට තිබූ වැලි පැටවීම හා ABC පැටවීම ABC තුනිකිරීම ආපසු ප්‍රා.ස. වෙත | | | 2.00 |
| 2022.05.20 | ප්‍රා.ස. සිට සභාව අසළ වැටේ කොන්ක්‍රීට් කණු ගැලවීම ආපසු ප්‍රා.ස. දක්වා | | | 1.00 |
| 2022.05.23 | ප්‍රා.ස. සිට 22/32 නිවසේ ඉඩමට යාම | | | 0.20 |
| | ඉඩමේ පස් තුනි කිරීම | | | 3.00 |
| | ආපසු ප්‍රා.ස. වෙත (මුදල් ගෙවා) | | | 0.20 |
| 2022.05.24 | ප්‍රා.ස. සිට 22/32 ඉඩමට යාම | 20 | | 0.20 |
| | ඉඩමේ පස් තුනී කිරීම | | | 2.00 |
| | ආපසු ප්‍රා.ස. වෙත (මුදල් ගෙවා) | | | 0.20 |
| 2022.05.25 | ප්‍රා.ස. සිට 22/32 ඉඩමට යාම | 100 | | 0.20 |

| | | | | |
|---|---|---|---|---|
| | ඉඩමේ පස් තුනී කිරීම | | | 5.00 |
| | ආපසු ප්‍රා.ස. වෙත (මුදල් ගෙවා) | | | 0.20 |
| 2022.05.26 | ප්‍රා.ස. සිට පොලිසිය පිටුපස තාප්පයක් ගැලවීම (මුදල් ගෙවා) | | | 1.20 |
| 2022.05.27 | ප්‍රා.ස. සිට ප්‍රා. ලේකම් කාර්යාලයේ පස් පැටවීම | | | 0.50 |
| 2022.05.30 | ප්‍රා.ස. සිට දමිත් ටයර් හවුස් ආයතනය වෙත පැව් දැමීම සඳහා ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 0.20 |
| | මේ මස ලබා ගත් ඉන්ධන | **235 L** | | |
| | මුළු ඉන්ධන ප්‍රමාණය | | **235 L** | |
| | වැය වූ ඉන්ධන ප්‍රමාණය හා ධාවනයේ යෙදි ඇති පැ.මී. ගණන (ඉන්ධන ලීටර් 08 කින් පැ.මී. 01 ක් ධාවනය කළ හැකිය. මෙම මස පැ.මී. 19.9 ක් ධාවනයේ යෙදී ඇත) | | **159.2** | **19.9** |
| | මෙම මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | | **75.8 L** | |

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා.**

ලගකදී සිට ධාවන සටහන් වාර්තා සභාවාර්තාව සමග නොලැබෙන බවත් ,මෙය සභාවාර්තාව සමග ලැබිය යුතු බවත් , ගෙදරදී එය පරිශීලනය කල යුතු බවත් ප්‍රකාශ කරන ලදි. සභාව තිබෙන දවසට එය බෙදාගෙන යන බවත් ,මින් ඉදිරියට එසේ නොවිය යුතු බවත් , සභා වාර්තාව සමග ධාවන සටහන් අනිවාර්යයෙන්ම ලැබිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.ZA 3741 බැකෝ ලෝඩරයේ ධාවන සටහන් වල පටන් ගැන්ම නැති බවත් ,පසු ගිය ඉතිරි ඉන්ධන නැති බවත් , වැය 235 ක් තිබෙන බවත් 159 ක් ඉතිරි තිබෙන බවත් ,වැඩ කර ඇත්තේ 19.9 බවත් සටහන් වී ඇති බවත් එය පිළිබඳ විමස්න ලදි.

**ගරු සභාපතිතුමා.**

මෙම ධාවන සටහනේ යම් ගැටළුවක් ඇති බවත් , ලබන සභා වාරයේදී එම ධාවන සටහන නැවත නිවැරදිව ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදි. මෙම ධාවන සටහන සඳහා අනුමැතිය ලබා නොදෙන ලෙස ඉල්ලා සිටින ලදි.

09. වෙනත්

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන්ගේ නිවාඩු සම්බන්ධ ලිපි සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම .

1. පූජ්‍ය උඩවෙල ධම්මතිලක හිමි — ගරු ප්‍රා.ස.මන්ත්‍රී
2. පි.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය — ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී
3. එම්.එම්. මාලක මිහිර බණ්ඩාර මයා — ගරු ප්‍රා.ස.මන්ත්‍රී
4. කේ.එම්. කුලතුංග මයා — ගරු ප්‍රා.ස.මන්ත්‍රී
5. ආර්.ඒ.ඩී. සිසිර ශාන්ත කුමාර මයා — ගරු ප්‍රා.ස.මන්ත්‍රී
6. කේ.වී.පී. නයනා කුමුදුනි මිය — ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී
7. එන්. අමරකිර්ති මයා — ගරු ප්‍රා.ස.මන්ත්‍රී

8. **එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මයා** **ගරු ප්‍රා.ස.මන්ත්‍රී**

මූලාසනය.

න්‍යාය පත්‍රානුකූලව අදට නියමිත වැඩ කටයුතු අවසන් බවත් මීළඟ සභාවාරය 2022.09.08 වන දින පෙ.ව. 9.30 මෙම ස්ථානයේදී පැවැත්වෙන බවත් දක්වන ලදි. එදින ප.ව. 2.35 ට පමණ සභා කටයුතු අවසන් කරන ලදි.

ලේකම්
ප්‍රාදේශීය සභාව
උහන.

2022/08/09 දින රැස්වීමේදී සංශෝධන සහිතව/රහිතව සභා සම්මත කරන ලදි.

ගරු සභාපති.